NLDB
ESTD 1973



Annual Report 2010

National Livestock Development Board

වාර්ෂික වාර්තාව

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ සභාපති හා අධ්‍යක්ෂ මණ්ඩලය 2010 ජනවරි මස 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා වන කාල පරිච්ඡේදය සඳහා මෙම වාර්තාව සතුටින් ඉදිරිපත් කරයි.

1.0 හැඳින්වීම

1972 අංක 11 දරණ කෘෂිකාර්මික සංස්ථා පනත යටතේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය (NLDB) 1973 වර්ෂයේ දී ස්ථාපිත කරන ලදී. එහි ක්ෂේත්‍ර කටයුතු ආරම්භ කරන ලද්දේ 1974වර්ෂයේ දී ය . 1977 වර්ෂයේ දී මණ්ඩලයේ කර්යයන් නව අරමුණකට යොමු කරමින් ඉලක්ක කරන ලද්දේ ජාතික ගව සම්පත පිරිහී යාම වැලක්වීම සහ කිරි නිෂ්පාදනය සහ බර ඇදීම යන කරුණු දෙකම අරමුණු කරගෙන උසස් ආරයේ ගවයින් හා මී ගවයින් ඇති කිරීමේ සීඝ්‍ර වැඩ සටහනකට අවධානය යොමු කිරීමට ය. පශුසම්පත් හා පොල් වගාව පවත්වාගෙන යන භෝග ඒකාබද්ධ ගොවිපලවල් 30 ක් වර්තමානයේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් නඩත්තු කරනු ලබයි. ගොවීනට න්‍යායික හා ප්‍රායෝගික දැනුම බෙද දෙන එක් පුහුණු මධ්‍යස්ථානයක් ද මණ්ඩලයට ඇත.

1.1 දර්ශණය

ජනතාවගේ සමාජ හා ආර්ථික තත්ත්වයන් වැඩි දියුණු කිරීම සඳහා ගුණාත්මක අභිජනන ද්‍රව්‍ය, පශු ු සම්පත් හා කෘෂි නිෂ්පාදන නිපදවන ශ්‍රී ලංකාවේ හොඳම ස්ව පැවැත්මක් ඇති ආයතනය බවට පත්වීම.

1.2 මෙහෙවර

- ❖ පශු සම්පත් හා කිරි නිෂ්පාදනයෙන් රට ස්වයංපෝෂිත කිරීමේ අරමුණ ඇති ව ගොවීන් වෙත බෝ කිරීම සඳහා සතුන් නොකඩවා නිකුත් කිරීමට සාධාරණ කාල පරිච්ඡේදයක් තුල දී පශු සම්පත් කටයුතු දියුණු කිරීම

- ❖ ආයතනයේ පිරිවැටුම හා ලාභදායිත්වය වර්ධනය කිරීම සඳහා නව තාක්ෂණය උපයෝගි කර ගනිමින් පශුසම්පත් හා ක්ෂීර නිෂ්පාදන සංවර්ධන කිරීම

- ❖ රටේ කෙටිකාලීන භෝග නිෂ්පාදන වැඩසටහනට අනුබල දෙනු පිණිස තෝරාගත් ගොවිපොල වල කෙටි කාලීන භෝග වගාකිරීම

- ❖ පශුසම්පත් හා කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ප්‍රශස්ථ නිෂ්පාදන මට්ටම් ලගා කර ගැනීම'

- ❖ පශුසම්පත් හා භෝග ඒකාබද්ධ ගොවිපලවල් ක්‍රමය තුලින් උපරිම ඵලදායිතාවයක් ලබා ගැනීම හා පරිසර හිතකාමී වගා ක්‍රම අනුගමනය කිරීම'

තෘප්තිමත් ශ්‍රම බලකායක් ඇතිව විවිධ කෘෂි දේශගුණික කලාප තුළ ස්ව පැවැත්මකින් යුතු පශු සම්පත් හා භෝග ඒකාබද්ධ ගොවිපලවල් සමූහයක් පවත්වාගෙන යාම.

1.3 **පොදු අභිමතාර්ථ**

1.3.1 පොල් මූලාශ්‍රිත කර්මාන්ත වලින් ලැබෙන අතිරික්ත මුදල් උපයෝගි කර ගනිමින් එහි පැවැත්ම සඳහා ගොවිපලවල් වල සියලුම ක්‍රියාකාරකම් ප්‍රශස්ථ මට්ටමකින් පවත්වා ගෙන යාම.

1.3.2 සාර්ථකව වෙළඳපොල තරඟ කිරීම සඳහා පිරිවැය අඩුකිරීමට හා නිෂ්පාදනය දියුණු කිරීමට වඩා හොඳ කළමනාකරණ ප්‍රතිපත්ති සමග නව තාක්ෂණය, විශේෂඥ දැනුම සහ ප්‍රාග්ධනය හඳුන්වා දීම.

1.3.3 පුද්ගලික අංශයේ සහභාගිත්වය ඇතිව මෙම ගොවිපොල/ඒකක ලාභදායි ව්‍යාපාර බවට පත් කිරීම සඳහා වඩා හොඳ අලෙවි උපාය මාර්ග සමග නව වෙළඳපළක් ඇතිකිරීමේ හැකියාව සොයා බැලීම.

1.4 අභිප්‍රායයන් (බලාපොරොත්තු)

මෙහි සඳහන් අරමුණු ළඟා කරගැනීම සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය බෝ කිරීම සඳහා උසස් තත්ත්වයේ සතුන් සුළු මුදලකට නිකුත් කරයි. ජාතික පශුසම්පත් සංවර්ධන මණ්ඩලය එක් එක් ගොවීන්ගේ අවශ්‍යතා සපුරාලනවා පමණක් නොව, පශු නිෂ්පාදකයින්ගේ සමිති, විවිධ රාජ්‍ය නොවන සංවිධාන, සමෘද්ධිලාභීන් මෙන්ම දැනට ක්‍රියාත්මක වන රජයේ සහ පෞද්ගලික අංශයේ ව්‍යාපෘති වල අවශ්‍යතාවයන් ද සපුරාලයි. අවශ්‍යතාවය ගවයින්, මී ගවයින්, එළුවන්, බැටළුවන්, ඌරන්, හාවුන්, කුකුලන් හෝ වටුවන් වුව ද බෝ කිරීම සඳහා හොඳ තත්ත්වයේ සතුන් ලබාදීමට ජාතික පශුසම්පත් සංවර්ධන මණ්ඩලය බැඳී සිටී.

පශු සම්පත් සංවර්ධන ක්ෂේත්‍රයේ ප්‍රධාන පරමාර්ථය ලෙස සලකමින් හුදෙක්ම ස්වාභාවික ඥාණයෙන් හා පළපුරුද්දෙන් කටයුතු කරන ගොවීන්හට සත්ව පාලනය පිළිබඳ දැනුම බෙදා දීමේ භාරදූර කාර්යය ඉටු කිරීම ද ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය භාරගෙන ඇත. සත්ව පාලනය ආර්ථික වශයෙන් ඵලදායි ව්‍යාපාරයක් ලෙසට පත් කිරීම ද මණ්ඩලයේ එක් බලාපොරොත්තුවකි. මෙය ළඟා කරගැනීම සඳහා එක් එක් කෘෂි දේශගුණික කලාපවලට සුදුසු වන පරිදි ගොවිපලවල් වල නුමුහුන් හා දෙමුහුන් සතුන් අභිජනන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

ජර්සි, ප්‍රීෂියන්, සහයිවාල්, කිලාරි, මුරා සහ නිලිරාවි ආදි උසස් ජානවලින් යුත් ගව තොග ආරක්ෂා කිරීමට තෝරාගත් ගොවිපලවල් වල ඔවුන් නඩත්තු කරන ලදී. ග්‍රාමීය ජනතාව තුල ස්වයං රැකියා ඇති කිරීම, විශේෂයෙන් සුළු වශයෙන් සත්ව පාලනයට ලැදි සුළු ගොවීන්ට ස්වයං රැකියා ඇති කිරීම සඳහා මණ්ඩලය මහඟු දයකත්වයක් ලබා දී ඇත. පශු සම්පත් අංශය සංවර්ධනය කිරීම විශේෂයෙන් කිරි ගවයින් හා කුකුලන් ඇති කිරීම මගින් ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවනවා පමණක් නොව, ඔවුන්ගේ පෝෂණ මට්ටම ද වර්ධනය කරයි. පස නිසරුවීම වැලැක්වීමට හා පසෙහි සාරවත් බව වර්ධනය කිරීමට විශේෂයෙන් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය මගින් පාලනය වන වතුවල පරිසර හිතකාමී ලෙස භූමිය පරිහරණ ශිල්පීය ක්‍රම ක්‍රියාවට නංවන ලදී.

1.4.1 ප්‍රධාන ක්‍රියාකාරකම්

මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම් පහතින් දැක්වේ.

- පශු සම්පත් අභිජනනය හා සංවර්ධනය
- බෝ කිරීම සඳහා හොඳ තත්ත්වයේ සතුන් සාධාරණ මිළකට ගොවින්ට නිකුත් කිරීම
- උපරිම ලාභයක් ඉපයිම සඳහා ප්‍රශස්ථ මටට්මින් පොල් වගාව පවත්වා ගෙන යාම
- හැකියාව ඇති ස්ථානවල පශු සම්පත් භෝග ඒකාබද්ධ ගොවිපලවල් ක්‍රියාත්මක කිරීම
- ගොවින්ට පාසැල් සිසුන්ට කෘෂි කර්මාන්තයේ නියැලි නිලධාරින්ට සහ විශේෂයෙන් කුඩා පරිමාණයේ සතුන් ඇති කරන්නන් හට පුහුණු වැඩ සටහන් හා ප්‍රදර්ශණ පැවැත්වීම
- සාධාරණ මිළකට හොඳ තත්ත්වයේ ගොවිපල නිෂ්පාදන සැපයීම සඳහා අලෙවිසැල් ස්ථාපනය කිරීම හා පවත්වාගෙනයාම
- ඉහළ ලාභ පරතරයක් ලබාගැනීම සඳහා ගොවිපලවල නිෂ්පාදිත අමුද්‍රව්‍ය භාවිතාකරමින් වටිනාකම එකතුකරන ලද භාණ්ඩ නිපදවීම
- ජනතාව අතර නැවුම් එළකිරි පරිභෝජනය ප්‍රචලිත කිරීම සඳහා ජනතාවට නැවුම් එළකිරි අලෙවි කිරීම

2.0 අධ්‍යක්ෂ මණ්ඩලය

2010 අප්‍රේල් මස පවැත්වුණු මහ මැතිවරණයෙන් පසු ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සඳහා නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කරන ලදී. ඒ අනුව 2010 අප්‍රේල් මස නව රජයක් පිහිටුවීමත් සමග ආර්. එම්. බි. ඇල්ලේගල සහ ලක්ෂමන් හුලුගල්ල යන මහත්වරුන් පිළිවෙළින් සභාපති හා නියෝජ්‍ය සභාපති ලෙස 2010 මැයි මස සිට ක්‍රියාත්මක වන පරිදි පත් කරන ලදී.

2010 වර්ෂය සඳහා පත් කළ නව අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් අයගෙන් සමන්විතවිය.

ආර්. එම්. බී. ඇල්ලේගල මහතා	සභාපති
ලක්ෂමන් හුලුගල්ල මහතා	නියෝජ්‍ය සභාපති
ඒ .ආර්. අනුර ජයසිරි මහතා	ක්‍රියාකාරි අධ්‍යක්ෂ/ අධ්‍යක්ෂ
එච්. එම්. ගුණසේකර මහතා	අධ්‍යක්ෂ
එස්. බාලචන්දිරන් මහතා	අධ්‍යක්ෂ
එස් .මර්වින් ඩබ්ලිව්. පෙරේරා මහතා	අධ්‍යක්ෂ
වෛද්‍ය සැම්සන් එල්. ඒ. ඩැනියෙල්	අධ්‍යක්ෂ
ආර්. අශෝක් කුමාර් මහතා	අධ්‍යක්ෂ
වෛද්‍ය ප්‍රේමකුමාර ද සිල්වා	අධ්‍යක්ෂ
රවින්ද්‍ර මනෝජ් ගමගේ මහතා	අධ්‍යක්ෂ

නව අධ්‍යක්ෂ මණ්ඩලයේ පළමු රැස්වීම 2010 ජූනි මස 28 දින පැවැත්වුණි . 2010 වසර තුල අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12 ක් පවත්වන ලදී.

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය යටතේ පැවැත්වුණි. ගරු ආරුමුගම් තොන්ඩමන් මැතිතුමා පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන කැබිනට් ඇමැතිවරයා වශයෙන් ද ගරු එච්. ආර්. මිත්‍රපාල මැතිතුමා නියෝජ්‍ය ඇමැතිවරයා වශයෙන් ද පත්විණි.

සමාලෝචිත වර්ෂය තුළ දී, ප්‍රධාන අරමුණ හා අවධාරණය වූයේ ආයතනය තුළ ඇති සම්පත් ප්‍රශස්ථ මට්ටමින් ප්‍රයෝජනයට ගනිමින් ආයතනයේ යටිතල පහසුකම් සංවර්ධනයත් සමග මණ්ඩලයේ ඵලදයිතාවය ඉහල නැංවීමය. වර්ෂය තුළ මණ්ඩලයට මූල්‍ය සම්පත් සීමිත වීම නිසා මූල්‍ය කරුණු දැඩි ලෙස පාලනය කිරීමට කටයුතු කරන ලදී . කෙසේ වෙතත් අවශ්‍ය සවර්ධන ක්‍රියාකාරකම් සඳහා ප්‍රමුඛත්වය දෙන ලදී . ඒ අනුව පශු සම්පත් කළමණාකරණ හා අභිජනන වැඩසටහන් සඳහා ඉහළ ප්‍රමුඛත්වයක් දෙන ලදී .

කිරි ගවයින්ගේ ජානවල වටිනාකම උසස් කිරීමට රට තුළ පළමු වරට කළල බද්ධ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරිමට මණ්ඩලය විසින් ඉතා වැදගත් තීරණයක් ගන්නා ලද අතර එය 2009 වර්ෂයේ දී සාර්ථක අන්දමින් නිම කරණ ලදී. සතුන් ආනයනය කිරීමේ වියදම් අඩුකිරීමට හා උසස් ජාන හඳුනාගත් වැඩි කිරි නිෂ්පාදනයක් දෙන සතුන් බිහිකිරීමට ඉදිරියේ දී මෙම වැඩසටහන මගින් හැකියාව ලැබේ.

තවද මණ්ඩලය කිරි ගවයින් ගහනය කෙටිකාලයක දී වැඩි කිරීමේ අරමුණෙන් ප්‍රථම වරට සංසේචනය කරන ලද බීජානු 2009 වසර තුලදී ආනයනය කරන ලදී . මෙම වැඩසටහන දැනට සාර්ථක අන්දමින් කෙරී ගෙන යයි. මෙම වැඩසටහන ඉදිරියට ද කරගෙන යාමට මණ්ඩලය තීරණය කර ඇත. ඒ අනුව ඉහල ඝණත්වයක් ඇති සංසේචනය කරන ලද ශුක්‍රාණු ආනයනය කරනු ලබන අතර මේවා කිරි දෙනුන්ට ද සිංචනය කළ හැක.

ජනතාව අතර නැවුම් එළකිරි පරිභෝජනය ප්‍රචලිත කිරීමේ රජයේ උත්සහය සාර්ථක කිරීමේ අරමුණින් නැවුම් එළකිරි පරිභෝජනය ප්‍රචලිත කිරීමේ වැඩසටහනක් ලෙස කිරි බෙදා හැරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර එය පුළුල් කරන ලදී . කිරි පිටි ආනයනය කිරීම සඳහා යන විදේශ විනිමය සැලකිය යුතු ප්‍රමාණයකින් ඉතිරි කර ගැනීමට මෙම වැඩසටහන වක්‍රව දායක වේ. ග්‍රාමීය තරුණ තරුණියන්ට රැකියා අවස්ථා සපයමින් හා කිරි වලට වටිනාකමක් එකතු කරමින් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ආදායම වර්ධනය කිරීමටත් මෙම වැඩසටහනින් මාර්ගය සැලසිණි.

2010 වසරේ දී දිගු කලකට පසු, තෘණ කිලෝ ග්‍රෑම් 2050 ක් සහ රනිල බීජ ආනයනය කිරීමට මණ්ඩලය සමත් විය. මෙම ද්‍රව්‍යයන් ආනයනයත් සමග කිරි ගව අංශයේ කිරි නිෂ්පාදනය හා සතුන් උත්පාදනය වල වර්ධනයක් මණ්ඩලය අපේක්ෂා කරයි.

2009 වසරේ දී 27,000 ක අතිරේක බ්‍රොයිලර් මව් සතුන් සහ 5000 ක ලේයර් මව් සතුන් NLDB, LANLIB සහ මහවැලි පශු සම්පත් සමාගම යන ආයතන වලට ආනයනය කිරීම මගින් රටේ පැවැති බ්‍රොයිලර් මස් සහ බිත්තර නිෂ්පාදන හිගය මගහැරීම සඳහා මණ්ඩලය දායක වුණි. තව ද 2010 වසරේ දී රටේ පැවැති බිත්තර හිගයට ක්ෂණික විසඳුමක් වශයෙන් අතිරේක දිනක වයසැති වාණිජ කුකුළු පැටවුන් 100,000 ක් ආනයනය කරන ලදී.

වල් නෙලීම, ඉඩම් එළිපෙහෙළි කිරීම සහ මණ්ඩලයට ඉක්මනින් විසඳිය යුතුව තිබූ ප්‍රධාන කාර්යාලය ඇතුලු ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම් යනාදිය සාර්ථකව 2010 වසරේ දී සම්පූර්ණ කරන ලදී.

සංවර්ධන ක්‍රියාකාරකම් වල කාර්ය සාධනය

1. කළල බද්ධ වැඩසටහන

කළල බද්ධ වැඩසටහන පුරෝගාමී ව්‍යාපාරයක් ලෙස වසර 2006 දී මණ්ඩලය විසින් ආරම්භ කරන ලදී . මෙම පුරෝගාමී ව්‍යාපාරය ආරම්භ කරන ලද්දේ උසස් වර්ගයේ සතුන් එළදායි මිලකට ලබාගනිමින් කිරි ගව පට්ටි කර්මාන්තයට නව උද්වේගයක් ලබා දීමට ය.

ෆ්‍රීෂියන් , ජර්සි, ඔස්ට්‍රේලියන් ෆ්‍රීෂියන්, සහිවාල් වර්ගයේ ශීතකළ කළල 200 ක් හා කළල 196 ක් ලංකාවේ ප්‍රථම වතාවට බද්ධ කරන ලද අතර කළල බද්ධ කොට ඉපදුණු වසු පැටවුන් 61 ක් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට ලැබිණ. උපදින ලද වසු පැටවුන් අතරින් මරණ 9 ක් සිදු විය. බෝ කරගන්නා ලද ඉතිරි සතුන් 52 අතරින් 22 ක් ගැහැණු සතුන් වන අතර 30 ක් පිරිමි සතත් වේ. මෙම වැස්සියන් ගෙන් දිනකට කිරි ලීටර් 20 කට වඩා නිෂ්පාදනය කිරීමේ හැකියාවක් ඇත .

මෙම කළල ලබා ගන්නා ලද්දේ ලෝකයේ අද සිටින හොඳම පට්ටි ගොන්නුන් හා ඉහල කිරි නිෂ්පාදනයක් ලබා දෙන දෙනුන් ගෙන් ය. කළල මගින් උපත ලද වසු පැටවුන් ගේ සැලකිය යුතු වටිනාකමක් ඇත. හේතුව ඔවුන් කෘතිම සිංචනය මගින් උපත ලද සතුනට වඩා හොඳ වීම ය. කළල මගින් උපත ලද වස්සෙකුට 90,000 -100,000 දක්වා ශුක්‍රාණු මාත්‍රා (වඩි) නිෂ්පාදනය කළ හැකි බැවින් කළල මගින් බිහි වෙන වසු පැටවුන් ගෙන් රටට අති විශාල වටිනාකමක් ඇති අතර ආසන්න වශයෙන් රුපියල් මිලියන 1800 කින් පමණ විදේශ විනිමය ඉතිරි කර ගැනීමට හැකිවනු ඇත . මෙලෙස බිහි වූ ගැහැණු වසු පැටවුන් මෙවැනි කළල බද්ධ වැඩසටහන් වලට භාවිතා කළ හැකි වන අතර මව් සතුන් උසස් ගණයේ පට්ටි ගොන්නුන් බිහි කිරිමට උපයෝගි වනු ඇත. මෙම කටයුත්ත සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය ගොන්නුන් 07 දෙනෙකු කුණ්ඩසාලේ පිහිටි සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තුමේන්තුවේ කෘතිම සිංචන මධ්‍යස්ථානය වෙත පරිත්‍යාග කර ඇත. තව ද තවත් වසු පැටවුන් 07 දෙනෙකු මහා පරිමාණයෙන් සතුන් ඇති කරන ගොවින්ට ද නිකුත් කරන ලදී.

කළල බද්ධ මගින් උපත ලද වස්සන් (7 ගොන්නුන්) මගින්
විදේශ විනිමය ආපසු ලබා ගැනීම

ආනයනය කරන ලද ශුක්‍රාණු මාත්‍රය(dose)	- රු. 3,000/
දේශිය වශයෙන් නිෂ්පාදිත ශුක්‍රාණු මාත්‍රයක මිළ	- රු. 250/
විදේශ විනිමය ඉතිරිය	- රු. 2,750/
කෘතිම සිංචන මධ්‍යස්ථායට පරිත්‍යාග කරන ලද වස්සන්	- 100,000
ඉතිරි කර ගත හැකි විදේශ විනිමය	**- රු.1925 මිලියන**

කළල බද්ධ මගින් උපත ලද ගැහැණු වසු පැටවුන් (සතුන් 22) ගෙන්

කළල බද්ධ වැඩසටහන සඳහා වූ සම්පූර්ණ වියදම	- රු. 12 මිලියන
උපත දක්වා වසු පැටවෙකුට වන වියදම	- රු 0.23 මිලියන
අභිජනනය දක්වා වන කල්පිත වියදම	- රු 0.10 මිලියන
අභිජනනය දක්වා අපේක්ෂිත මුළු වියදම	- රු 0.33 මිලියන
ආනයනු කරනු ලබන සතෙකුගේ පිරිවැය	- රු 0.8 මිලියන
සතෙකු සඳහා ඉතිරි වන විදේශ විනිමය	- රු 0.47 මිලියන
ඉතිරි වන විදේශ විනිමයෙහි එකතුව	**- රු 10.34 මිලියන**
මුළු ඉතිරිය	**- රු 1935 මිලියන**

බද්ධ ක්‍රමයෙන් ශ්‍රී ලංකාවේ බෝපත්තලාවේ ගොවිපලේ දී 2007 දෙසැම්බර් මස 3 වන දින උපත ලැබූ " අපේක්ෂා" නමැති ප්‍රථම වසු පැටවා

කළල බද්ධ වැඩසටහනෙහි 2010 /12/ 31 දිනට ප්‍රගතිය

කළලයන්

ආනයනය කරන ලද කළල සංඛ්‍යාව	20
හානියට පත් හා අතුරුදහන් සංඛ්‍යාව	04
බද්ධ කරන ලද කළල සංඛ්‍යාව	196
එකතුව	**200**

සියළු කළල් බද්ධ උපත් අවසානයේ වර්තමාන තත්ත්වය

කළල අවස්ථාවේ මරණ පළවන 28-60 දින	-15
පූර්ණ ගර්භ ගබ්සාකිරීම්	-05
දුර්වල උපත් (උපත් වලින් පසු මරණ)	-01
උපතේ දී මරණ	-01
මරණ	-07
සම්පූර්ණ මරණ සංඛ්‍යාව	-09
සම්පූර්ණ උපත් සංඛ්‍යාව	-61
වර්තමානයේ සජීවි හා සෞඛ්‍ය සම්පන්න සංඛ්‍යාව	-52 (ගැහැණු 22, පිරිමි 30)
සමස්ථ සාර්ථකත්වයේ අනුපාතය	- 39%

2. ලිංගය වර්ග කරන ලද ශුක්‍රාණු මගින් කෘතිම සිංචනය (Artificial Insemination)

මණ්ඩලය ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට ඇමරිකානු එක්සත් ජනපදයෙන් ශීත කරන ලද ලිංගය වර්ග කළ ශුක්‍රාණු ඒකක 200ක් ගෙන්වන ලද අතර ඒවා ප්‍රිෂියන් හා ජර්සි වර්ගයේ විය. මෙහි අරමුණ වූයේ වර්තමානයේ 50% ක් ව පවතින ගැහැණු සතුන් ගේ උපත 93% දක්වා ඉහල දැමීමය. මණ්ඩලය මෙම වැඩසටහන අත්හද බැලීමක් වශයෙන් සිදුකිරීමට අදහස් කරන අතර මෙහි සාර්ථකත්වය මත මෙය සියළුම ගොවිපොලවල් සඳහා ව්‍යාප්ත කිරීමට කරයි.

තවද මණ්ඩලය මෙම වැඩසටහන හරහා ඵලදයිතාවය වැඩි ගැහැණු සතුන් ජනතාව වෙත නිකුත් කරන සංඛ්‍යාව වැඩි කිරීමටත් ඒ හරහා දේශිය කිරි නිෂ්පාදනය වැඩි කර ගැනීමටත් අදහස් කරයි.

ලිංගය වර්ග කළ ශුක්‍රාණු සිංචනය කොට ප්‍රථම වතාවට ලංකාවේ බිහි කළ පළවන වැස්සිය

උපන්නේ 2010 පෙබරවාරි 3 වන දින බෝපත්තලාව ගොවිපලේ දීය.

ලිංගය වර්ග කළ ශුක්‍රාණු කෘතිම සිංචන වැඩසටහනෙහි ප්‍රගතිය
ලිංගය වර්ග කළ ශුක්‍රාණු භාවිතය

- ආනයනය කරන ලද මුළු එකතුව -200
- මෙතෙක් භාවිතා කළ එකතුව -146 (ප්‍රීෂියන්-76 ජර්ෂි-70)
- ඉතිරි -54 (ප්‍රීෂියන්-24 ජර්ෂි-30)

ගර්භණීත්වය පරික්ෂාවට ලක් කළ කෘතිම සිංචනය කළ සතුන්	- 113
ගැබ්ගත් සතුන් ගේ එකතුව	- 55
මෙතෙක් ලද සාර්ථකත්වයේ අනුපාතය	- (55/113) x 100%
	- 48.6%



Advantages of Sexed Semen:

- ❖ Results (to be a female calf) are predictable about 93% of the time.
- ❖ Handy tool to increase heifer heard within the shortest period.
- ❖ Reducing carving difficulties on heifers.
- ❖ A good cow heard can be built up in the Board.
- ❖ Cull rate of the cow could be reduced.
- ❖ The milk production could be increased by 2-3 times within the shortest period.
- ❖ Issue of breeding materials to the public could be increased by 2-3 times in the future.
- ❖ The Cost of female calf would be reduced by 50%
- ❖ Slaughtering of Cattle could be reduced.

සංසේචනය කරන ලද ශුක්‍රාණු වල වාසි :

- ❖ ප්‍රතිඵල (වැස්සි පැටවෙකු වීමේ) ප්‍රතිඵල 93% වාරයක දීම පාහේ කලින් ම කිව හැකි වීම
- ❖ ඉතා කෙටි කාලයක් තුළදී වැස්සියන් ගේ සංඛ්‍යාව වැඩි කර ගැනිමේ පහසු උපකරණයක් වීම
- ❖ වැස්සියන් ගේ පැටව් බිහි කිරීමේ දුෂ්කරතාවයන් අවම කරීම
- ❖ හොඳ එළදෙනුන් සංඛ්‍යාවක් මණ්ඩලය තුළ ගොඩ නැගීමේ හැකියාව
- ❖ රැලෙන් ඉවත් කිරීමේ අනුපාතය අඩු කර ගැනිමේ හැකියාව
- ❖ ඉතා කෙටි කාලයක් තුළදී කිරි නිෂ්පාදනය 2-3 ගුණයකින් වැඩි කර ගැනිමේ හැකියාව
- ❖ අභිජනනය සඳහා ජනතාව වෙත සතුන් නිකුත් කිරීමේ හැකියාව 2-3 ගුණයකින් වැඩි කර ගත හැකි වීම
- ❖ වැස්සි පැටවෙකු ගේ පිරිවැය 50% කින් අඩු වීම
- ❖ ගව ඝාතනය අඩු කර ගැනීමට හැකි වීම

3. දියර කිරි පරිභෝජනය ප්‍රවර්ධනය කිරීම

ප්‍රාදේශීය කිරි නිෂ්පාදනය හා පරිභෝජනය වැඩි කිරීම ඉලක්ක කරගනිමින් 2004 වසරේ සිට මණ්ඩලය රටේ ජනතාව අතර නැවුම් එළ කිරි පරිභෝජනය ප්‍රවර්ධනය කරන ලදී . 2006 වර්ෂයේ දී මෙම වැඩසටහන වේගවත් කරමින් ඉල්ලුම සපුරාලීමට මණ්ඩලය 2006 සිට 2008 දක්වා කාලය තුල දී රටේ විවිධ ප්‍රදේශ වල කිරි අලෙවිහල් 150 ක් විවෘත කරන ලදී . වර්තමානයේ නැවුම් එළ කිරි අලෙවිය දිනකට ලීටර් 4500 දක්වා වැඩි වී ඇත .

මෙම වැඩසටහන යටතේ කිරි අලෙවිහල් 150 ක් නියෝජිත අලෙවිහල් 109 ක් කොළඹ සහ අවට ප්‍රදේශවල විවෘත කරන ලදී. වසර 2010 තුල දී මෙම අලෙවිහල් මාර්ගයෙන් කිරි ලීටර් මිලියන 0.8 ක් මහජනතාවට අලෙවි කර ඇත. සමහර කිරි අලෙවිහල් වල පවතින පාඩු මග හරවා ගැනීම පිණිස පුද්ගලික අංශය සමග බද්ධ ව්‍යාපාරයක යෙදීමට මණ්ඩලය දැනට තීරණය කර ඇත .

	2005	2006	2007	2008	2009	2010
කිරි අලෙවිහල් ගණන	04	37	120	150	150	150
නියෝජිත අලෙවිහල්ගණන				76	109	109
විකුණන ලද නැවුම් එළ කිරි (ලීටර් මිලියන)	0.54	0.78	0.94	1.37	1.2	0.8

4. **බ්‍රොයිලර් මස් හා බිත්තර හිඟය මග හැරවීමට වසර 2010 සහ 2011 තුල දී අතිරේක මව් සතුන් ආනයනය කිරීම**

පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යවරයාගේ මෙහෙයවීම යටතේ පවතින දේශීය ඉල්ලුම සපුරාලීමට කුකුල් පැටව් මව් සතුන් තොග සහ දිනක් වයසැති වාණිජ බිත්තර දමන කිකිළි පැටවුන් ආනයනය කරන ලදී. විස්තර පහත දැක්වේ.

මෙම වැඩසටහන යටතේ දිනක් වයසැති කුකුල් පැටවුන් සඳහා පවතින ඉහල ඉල්ලුම සපුරාලීමට අතිරේක දිනක් වයසැති බ්‍රොයිලර් මව් සතුන් 27000 ක් රටට ආනයනය කරන ලද අතර මෙමගින් ජාතික මස් නිෂ්පාදනය සඳහා අපේක්ෂිත දායකත්වය 5% කි. (4,300 MT/ 102,000MT*100)

ජාතික මස් නිෂ්පාදනය සඳහා ජාතික පශු සම්පත් මණ්ඩලයේ දායකත්වය 3 % කි. (4,300MT/102,000 (National)MT*100)

මුළු දායකත්වය 8 %

මෙම වැඩසටහන යටතේ 5000 ක අතිරේක දිනක් වයසැති බිත්තර දමන කිකිළි පැටවුන් ද ආනයනය කරන ලදී. එමගින් **ජාතික බිත්තර නිෂ්පාදනය සඳහා අපේක්ෂිත දායකත්වය 10 % කි .**

(මිලියන 115 බිත්තර/ මිලියන 1140 බිත්තර (ජාතික)*100)

5. **බිත්තර හිඟය පාලනය කිරීම සඳහා දිනක් වයසැති වාණිජ බිත්තර දමන කිකිළි පැටවුන් ආනයනය කිරීම**

මෙම වැඩසටහන යටතේ 200000 ක දිනක් වයසැති වාණිජමය බිත්තර දමන කිකිළි පැටවුන් ආනයනය කරන ලදී . (200000* 95 % *300/කිකිළි= බිත්තර මිලියන 57). කිකිළි පැටවුන් 125000 ක් මෙම වසරේ මෙතෙක් ආනයනය කර තිබේ.

රටට අපේක්ෂිත දායකත්වය 5 % කි. (බිත්තර මිලියන 57/ බිත්තර මිලියන 1140*100)

වසර 2011 දී බිත්තර සඳහා ජාතියට මුළු දායකත්වය 15 % කි.

6. පශු සම්පත් ආහාර ඇඹරුම්හල්

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය විසින් පශු සම්පත් ආහාර නිෂ්පාදනය පහත සඳහන් කර්මාන්තශාලාවල දී මෙම වසරේ දී ආරම්භ කරන ලදී.

01. රොසිටා ගොවිපල

02. හොරකැලෙ ගොවිපල

03. මිරිස්වත්ත ගොවිපල

04. කරඳගොල්ල ගොවිපල

ආඬිගම ගොවිපලේ දී පශු සම්පත් ආහාර නිෂ්පාදනය මෙම වසර තුළ ආරම්භ කිරීමට නියමිතය. නිෂ්පාදනය කරනු ලබන අතිරික්ත ආහාර සාධාරණ මිළකට නුදුරු අනාගතයේ දී දේශීය ගොවීන්ට විකිණීමට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සැලසුම් කර ඇත.

7. තෘණ බීජ ආනයනය හා තෘණ සංවර්ධන වැඩසටහන

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ගොවිපල වල ක්ෂේත්‍රයෙහි ඇති තෘණ පෝෂ්‍යදායක අතින් පහළ මට්ටමකින් පවතින බැවින් මෙම ගැටළුව මගහරවා ගැනීම පිණිස පෝෂ්‍යදායක අතින් උසස් තෘණ හා රනිල බීජ වර්ග වසර 08 ක කාලයකට පසු මේ වසරේ දී මණ්ඩලය විසින් ආනයනය කරන ලදී.

මෙම වැඩසටහන යටතේ ස්ටයිලෝසන්තස් (Stylosanthus), ඩෙකම්බන්ස් (Decumbance), කිකුයා (Kikuya), හා වයිට් ක්ලවර් (White Clover) වර්ගයේ බීජ කිලෝ ග්‍රෑම් 2050 ක් ආනයනය කරන ලදී.

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ගොවිපල වල තෘණ සංවර්ධන කටයුතුවල කාර්යය සාධනය පහත දැක්වේ.

	2005	**2006**	**2007**	**2008**	**2009**	**2010**
වවන ලද අක්කර ප්‍රමාණය	200	522	273	367	90	333

8. **කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන**

පසුගිය කාලවල දී තෘණ බිම් හෝ පොල් වගාවන් සඳහා පොහොර වශයෙන් ගොම පොහොර යොදන ලදී . මෙම ක්‍රියාවලියේ දී ගොම විශාල වශයෙන් නාස්තිවනු දක්නට ලැබුණි . එම නිසා ගොවිපලවල් වල කාබනික පොහොර නිෂ්පාදනය කොට අගය එකතු කළ නිෂ්පාදනයක් ලෙස විකිණීමට මණ්ඩලය තිරණය කළේය . කාබනික එළවළු හා පළතුරු සඳහා සැලකිය යුතු ඉල්ලුමක් රටෙහි පවතින බැවින් මෙම කාබනික පොහොර විකිනීමෙන් සෑහෙන ආදයමක් උපයා ගත හැකි බවට මණ්ඩලය බලාපොරොත්තු වේ. සඳ වැඩිවෙමින් පවතින පොහොර මිළ ද මෙවැනි ව්‍යාපෘතියකට නැඹුරුවීමට තවත් එක් හේතුවක් විය.

වසර 2006 සිට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය රසායනික පොහොර වලට විකල්පයක් වශයෙන් මණ්ඩලයේ කිරි පට්ටි ගොවිපලවල් වල කාබනික පොහොර නිෂ්පාදනය ආරම්භ කර තිබුණි .

2006-2010 කාල පරිච්ඡේදය තුළ කාබනික පොහොර නිෂ්පාදනය පහත දැක්වේ.

	2006	2007	2008	2009	2010
කාබනික පොහොර (මෙ. ටො)	83	245	315	325	316
විකුණූ කාබනික පොහොර(මෙ. ටො)	15.5	16.7	15.9	14.2	78

ඉතිරි කාබනික පොහොර තොග ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ පොල් වගාවන්ට භාවිතා කරන ලදී .

9 . පොල් වගාව

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය හෙක්ටෙයාර් 4373 ක් පමණ ඉඩම් ප්‍රමාණයක පශු සම්පත් සංවර්ධන ක්‍රියාකාරකම් සමග ඒකාබද්ධ කොට පොල් ත්‍රිකෝණයේ හා නුවර ප්‍රදේශයේ මැද කොටසේ පිහිටි වතු 14 ක පොල් වගා කටයුතු සාර්ථකව නඩත්තු කරයි. මණ්ඩලයේ වාර්ෂික පොල් නිෂ්පාදනය ගෙඩි මිලියන 22 ක් පමණ වේ. එලදාවේ ගෙඩි බහුතරය පොල් සංවර්ධන අධිකාරියේ වෙන්දේසියේ දි විකුණනු ලබන අතර සැලකිය යුතු ගෙඩි ප්‍රමාණයක් කොප්පරාවලට ද හරවනු ලැබේ.

සාරවත් පොල් වත්තක්

ඉහළ පොල් අස්වැන්නක්

යටි වගා වැඩසටහන -2008-2010 (ගොවිපල ඒකාබද්ධ ක්‍රමය යටතේ)

	2008	2009	2010
වගා කළ අක්කර ප්‍රමාණය		**87**	**199**

විදේශ සම්භව සහිත ගස් පිළිබඳ ක්ෂේත්‍ර පර්යේෂණ මධ්‍යස්ථාන විවිධ ස්ථානවල ස්ථාපිත කිරීම

රිනෙල් අයිලන්ඩ් ටෝල්, ටැග්නනම් ටෝල්, මැලේයන් රෙඩ් ඩුවෝප් සහ සන් රැමෝන් නමින් හඳුන්වන විදේශීය පොල් වර්ග සඳහා අපගේ ගොවිපලවල් වල විවිධ ස්ථානවල ක්ෂේත්‍ර පර්යේෂණ පොල් පර්යේෂණ මණ්ඩලයේ සහය ඇතිව ස්ථාපිඨකරන ලදී.

ගොවිපල	සිට වූ දිනය	පැල ගණන
මරඳවිල	2008 මැයි	478
බෙලිගම	2008 ජුනි	487
සිරින්ගපාත	2008 නොවැම්බර්	619
පොලොන්නරුව	2009 ජනවාරි	522

මෙම පැල අපේක්ෂිත ආකාරයෙන් ප්‍රගතියක් පෙන්නුම් කරයි.

6 . මානව සම්පත් සංවර්ධනය

නායකත්ව කුසලතා සංවර්ධණය

මණ්ඩලයේ ඵලදායිතාවය වැඩි දියුණු කිරීමේ අරමුණෙන් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ සියළුම ජ්‍යේෂ්ඨ විධායක නිලධාරීන් ඔවුන්ගේ නායකත්ව කුසලතා හැකියාවන් වර්ධණය කර ගැනීම සඳහා වැඩ මුළුවක් 2010 වසරේ දී පවත්වන ලදී .

7. අලෙවි සංවර්ධනය

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ නව කිරි අලෙවි හලක් තැනීම

පාරිභෝජකයින්ට නිදහසේ නැවුම් කිරි වීදුරුවක් පානය කිරීම සඳහා සියළුම පහසුකම් සහිත නවීන පන්නයේ කිරි අලෙවි හලක් ප්‍රධාන කාර්යාලයේ පරිශ්‍රයේ තනන ලද අතර මෙම අලෙවි හල 2010 නොවැම්බර් මස 17 වනදා විවෘත කරන ලදී .

ප්‍රධාන කාර්යාලයේ අලෙවි මධ්‍යස්ථානයේ අළුත්වැඩියා කටයුතු

8. යටිතල පහසුකම් සංවර්ධනය

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලයේ හා ගොවිපලවල් 30 ක සියළුම නවීකරන හා අළුත්වැඩියා කටයුතු මෙම වසර තුළ සම්පූර්ණ කරන ලදී .

එද (2009)

අද (2010)

9 .2 ප්‍රවේශ ශාලාව නවීකරනය (2010)

9 .3 ශ්‍රවණාගාරය නවීකරනය (2010)

9 .4 අළුතින් තනන ලද සභාපති තුමා ගේ කාමරය (2010)

9 .5 අළුතින් තනන ලද නියෝජ්‍ය සභාපති තුමා ගේ කාමරය (2010)



බෝපත්තලාව හා ඩයගම ගොවිපල වල නව කිරි දෙවන යන්ත්‍ර දෙකක් සවි කරන ලදී (2010)

4.0 මණ්ඩලයේ ඉඩම් ප්‍රමාණය හා පශු සම්පත් වර්ග 2010

ගොවිපලවල්	වපසරිය හෙක්ටෙයර	එළ ගවයින්	මී ගවයින්	එළුවන්	බැටළුවන්	හාවුන්	ඌරන්	වාණිජ ලේයර්	වාණිජ බ්‍රොයිලර්	අභිජනන ලේයර්	අභිජනන බ්‍රොයිලර්
බෝපත්තලාව	1033.5	*		*							
ඩයගම	210.2	*									
රොසිටා	*52.7	*		*		*	*				
මහබෙරියතැන්න	174.9	*		*			*				
M.L.D.c	29.0	*									
කරඳගොල්ල	20.0										*
හාරගම	97.0	*	*			*					
ආඬිගම	466.3	*			*						
ගල්පොකුණ	356.3	*									
කොවුල් වැව	404.5	*		*							
ඔරුඳවිල	921.6	*	*								
රුක්කත්තන	406.8	*			*						
සිරිංගපාත	472.2	*									
නාරන්ගල	216.2	*									
මැල්සිරිපුර	567.2	*	*					*	*		
බෙලිගම	269.2	*									
වැලිකන්ද	413.8	*									
කන්දකඩුව	2266.0		*								
නිකවැරටිය	*730.6	*	*								
ජපාලොන් තලාව	245.3	*									
කොට්ටුකච්චිය	340.0	*	*	*							
ඔයාමඩුව	1002.7	*									
පරසංගස්වැව	622.7	*									
වැලිසර	*7.0		*				*	*			
මිරිස් වත්ත	17.4										
වීරවිල	220.5	*	*	*				*			
රිදියගම	1510.9	*	*								
හොරකැලේ	368.8	*			*	*	*				
පොළොන්නරුව	*1144.8	*	*					*			
මාටින්	390.7		*								
මාරවිල	6.0									*	
මුළු එකතුව	**14984.8**	**25**	**11**	**6**	**3**	**3**	**4**	**4**	**1**	**1**	**1**

5.0 පසුගිය වසර 4 තුළ භෞතික ප්‍රගතිය

පශු සම්පත් හා භෝග නිෂ්පාදන

වගුව (2)

	ක්‍රියාකාරකම්	ඒකක	2007	2008	2009	2010
5.1	**පශු සම්පත් ප්‍රමාණය**					
	එළ ගවයින්	ඒකක	8,272	8,199	8,621	8,329
	මී ගවයින්	ඒකක	2,114	2,130	2,191	2,409
	එකතුව	ඒකක	**10,386**	**10,329**	**10,812**	**10,738**
	එළුවන්	ඒකක	1,738	1,673	1,656	1,454
	බැටළුවන්	ඒකක	2,222	2,692	2,956	3,043
	අභිජනන ඌරන්	ඒකක	1,306	923	1,514	975
	කුකුළන්					
	බ්‍රොයිලර් මව් සතුන්	ඒකක	26,743	29,904	25,953	33,838
	ලේයර් මව් සතුන්	ඒකක	6,053	5,767	4,998	9,870
	වාණිජ ලේයර්	ඒකක	21,001	15,145	6,180	4,298
	වාණිජ බ්‍රොයිලර්	ඒකක	14,979	3,336	1,433	1,958
	වටුවන්	ඒකක	8,349	6,552	46	377
	තාවුන්	ඒකක	1,117	811	507	0
5.2	අභිජනන සඳහා පශු සම්පත් නිකුත් කිරීම					
	එළ ගවයින්	ඒකක	1,153	1,200	1,033	944
	මී ගවයින්	ඒකක	265	174	128	210
	එළුවන්	ඒකක	267	281	274	218
	බැටළුවන්	ඒකක	194	367	312	123
	ඌරන්	ඒකක	1,516	2,294	1,833	3,328
	තාවුන්	ඒකක	1,403	1,071	746	0
5.3	**කුකුල් පැටවුන් නිෂ්පාදනය**					
	බ්‍රොයිලර් (මිලියන)	ඒකක	2.08	2.3	1.8	1.8
	ලේයර් (මිලියන)	ඒකක	0.81	0.9	0.6	1.0
5.4	**කිරි නිෂ්පාදනය**					
	එළ ගවයින්	ලී-මිලි	2.9	3.2	3.3	3.2
	මී ගවයින්	ලී-මිලි	0.65	0.68	0.64	0.68
	එළු කිරි	ලී-මිලි	22,637	23,077	27,640	13,358
5.5	**බිත්තර නිෂ්පාදනය (මිලියන)**	ඒකක	4.1	3.4	1.9	1.0
	වටු බිත්තර නිෂ්පාදනය (මිලියන)	ඒකක	0.25	0.21	0.05	0.02

5.6	බ්‍රොයිලර් නිෂ්පාදනය (පක්ෂීන්)	මිලියන	0.09	0.09	0.01	0.01
5.7	පොල් නිෂ්පාදනය					
	නිෂ්පාදනය කළ ගෙඩි ගණන	මිලියන	21.73	20.55	21.48	20.60
	කොප්පරා නිෂ්පාදනය	මෙටො	537.4	278.7	336.71	247.85

6.0 පශු සම්පත් හා භෝග නිෂ්පාදන දත්ත

	ක්‍රියාකාරකම්	මිම්ම	2009	2010
6.1	**පශු සම්පත් ප්‍රමාණය**			
	එළ ගවයින්	ඒකක	8,621	8,329
	මී ගවයින්	ඒකක	2,191	2,409
	එකතුව		**10,812**	**10,738**
	එළුවන්	ඒකක	1656	1451
	බැටළුවන්	ඒකක	2,956	3,043
	අභිජනන ඌරන්	ඒකක	1,514	975
	හාවුන්	ඒකක	507	0
	කුකුළන් බ්‍රොයිලර් මව් සතුන්	ඒකක	25,953	33,838
	ලේයර් මව් සතුන්	ඒකක	4,998	9,870
6.2	**අභිජනනය සඳහා පශු සම්පත් නිකුත් කිරීම** එළ ගවයින්	ඒකක	1,033	944
	මී ගවයින්	ඒකක	128	210
	එළුවන්	ඒකක	274	218
	බැටළුවන්	ඒකක	312	123
	ඌරන්	ඒකක	1,833	3,328
	හාවුන්	ඒකක	746	0
	දිනක් වයසැති කුකුල් පැටවුන්	ඒකක මිලියන		
	බ්‍රොයිලර්	ඒකක මිලියන	1.8	1.8
	ලේයර්		0.6	1.0
6.3	**කිරි නිෂ්පාදනය** එළ ගවයින්	ලීටර මිලියන	3.3	3.2
	මී ගවයින්	ලීටර මිලියන	0.64	0.68
	බ්‍රොයිලර් නිෂ්පාදනය	සතුන් මිලියන	0.01	0.01
6.5	පොල් නිෂ්පාදනය නිෂ්පාදනය කළ ගෙඩි ගණන	ඒකක මිලියන	21.5	20.6
	කොප්පරා නිෂ්පාදනය	මෙ ටො	336.7	247.9

7. 2010 වසරේ කාර්යය සාධනය - පශු සම්පත් හා භෝග නිෂ්පාදන දත්ත

ක්‍රියාකාරකම්	මිම්ම	ප්‍රමාණය
එළ ගවයින්		
මුළු ප්‍රමාණය	ඒකක	8,329
වසර 2කට වැඩි වැස්සියන්	ඒකක	1,550
වසර 0-2 අතර වැස්සියන්	ඒකක	2,084
වසරට වැඩි වස්සන් ගණන	ඒකක	957
සම්පූර්ණ උපත්	ඒකක	2,613
අභිජනනය සඳහා සම්පූර්ණ නිකුත් කිරීම	ඒකක	944
රැළට නුසුදුසු ලෙස ඉවත් කිරීම	ඒකක	932
සම්පූර්ණ මරණ	ඒකක	631
සම්පූර්ණ එළ දෙනුන් ගණන	ඒකක	3,430
කිරි දෙවන එළ දෙනුන් ගණන	ඒකක	1,519
කිරි දෙවන එළ දෙනුන් ප්‍රතිශතය	%	57
කිරි දෙනකගේ දිනක සාමාන්‍ය කිරි නිෂ්පාදනය	ලීටර්	5.8
කිරි මුරයේ සාමාන්‍ය කාලය	දින	265
කිරි නිෂ්පාදනය	ලීටර් මිලියන	3.2
පළමු පැටවා බිහිකරන සාමාන්‍ය වයස	මාස	34
පැටවුන් බිහි කිරීමේ සාමාන්‍ය පරතරය	දින	363
කෘතිම සිංචනය කල සතුන් ගණන	ඒකක	3,471
මී ගවයින්		
මුළු ප්‍රමාණය	ඒකක	2,409
වසර 2කට වැඩි වැස්සියන්	ඒකක	611
වසර 0-2 අතර වැස්සියන්	ඒකක	481
වස්සන් ගණන	ඒකක	202
සම්පූර්ණ උපත්	ඒකක	642
අභිජනනය සඳහා් සම්පූර්ණ නිකුත් කිරීම	ඒකක	211
රැළට නුසුදුසු ලෙස ඉවත් කිරීම	ඒකක	219
සම්පූර්ණ මරණ	ඒකක	207
සම්පූර්ණ දෙනුන් ගණන	ඒකක	925
කිරි දෙවන දෙනුන් ගණන	ඒකක	442
කිරි දෙවන දෙනුන් ප්‍රතිශතය	%	45
කිරි දෙනකගේ දිනක සාමාන්‍ය කිරි නිෂ්පාදනය	ලීටර	6.0
කිරි මුරයේ සාමාන්‍ය කාලය	දින	254
කිරි නිෂ්පාදනය	ලීටර (මිලියන)	0.68
පලමු පැටවා බිහිකරන සාමාන්‍ය වයස	මාස	52
පැටවුන් බිහි කිරීමේ සාමාන්‍ය පරතරය	දින	511

කෘතිම සිංචනය කරන ලද සතුන් ගණන	ඒකක	45
කුකුළන්	ඒකක	
බ්‍රොයිලර් මව් සතුන්	ඒකක	
මුළු එකතුව	ඒකක	33,838
ආනයනය කරන ලද සතුන්	ඒකක	
පිරිමි ගැහැණු	ඒකක ඒකක	7,609 19,116
මුළු බිත්තර නිෂ්පාදනය	ඒකක	2,496,626
රැකිය හැකි බිත්තර නිෂ්පාදනය	ඒකක	2,332,740
පැටවුන් බිහි කිරීමේ ප්‍රතිශතය %	%	76
නිෂ්පාදිත කුකුළ් පැටවුන් ගණන	ඒකක	1,768,333
ලේයර් මව් සතුන් ප්‍රමාණය		
මුළු එකතුව	ඒකක	9,870
ආනයනය කරන ලද සතුන්		
පිරිමි ගැහැණු	ඒකක ඒකක	1,380 11,492
මුළු බිත්තර නිෂ්පාදනය	ඒකක	1,575,334
රැකිය හැකි බිත්තර නිෂ්පාදනය	ඒකක	1,417,274
පැටවුන් බිහි කිරීමේ ප්‍රතිශතය %	%	75
නිෂ්පාදිත කුකුළ් පැටවුන් ගණන	ඒකක	956,338
වාණිජ බ්‍රොයිලර් නිෂ්පාදනය		
මුළු එකතුව	ඒකක	1,958
බ්‍රොයිලර් නිෂ්පාදනය	සතුන්	7,114
වාණිජ බිත්තර නිෂ්පාදනය		
මුළු එකතුව	ඒකක	4,298
මුළු කිකිළියන් එකතුව	ඒකක	6,466
බිත්තර නිෂ්පාදනය	ඒකක (මිලියන)	1,118,710
ඌරන් ඇති කිරීමේ කාර්යය සාධනය		
මුළු එකතුව	ඒකක	975
ඉපදුනු ඌරු පැටවුන් ගණන	ඒකක	3,228
වරකට බිහිකරන පැටවුන් ගණන (ඊරියකගෙන්)	ඒකක	9
වරකට බිහිකරන පැටවුන් ගණන (නෑම්බියකුගෙන්)	ඒකක	8
මැරුණු ඌරු පැටවුන් ගණන	ඒකක	294
එළුවන් ඇති කිරීමේ කාර්යය සාධනය		
මුළු එකතුව	ඒකක	1,454
ඉපදුනු පැටවුන් ගණන	ඒකක	642
පැටවුන් දැමීමේ වාර ගණන	ඒකක	0.78
මැරුණු ගණන (වැඩිහිටි හා පැටවුන්)	ඒකක	191
අභිජනනය සඳහා නිකුත් කිරීම	ඒකක	218

බැටළුවන් ඇති කිරීමේ කාර්යය සාධනය		
මුළු එකතුව	ඒකක	3,043
ඉපදුනු පැටවුන් ගණන	ඒකක	1,434
පැටවුන් දැමීමේ වාර ගණන	ඒකක	0.75
මැරුණු ගණන (වැඩිහිටි හා පැටවුන්)	ඒකක	188
අභිජනනය සඳහා නිකුත් කිරීම	ඒකක	123
ගොවි පුහුණු වැඩසටහන් වල කාර්යය සාධනය		
පැවැති පාඨමාලා ගණන	ඒකක	108
සහභාගි වූවන් ගණන	ඒකක	3,597
පොල් නිෂ්පාදනය		
නිෂ්පාදිත ගෙඩි ගණන	ඒකක	20,602,480
කොප්පරා **නිෂ්පාදනය**	මෙට්‍රික් ටොන්	247.85

8.0 ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ සේවක ප්‍රමාණය

2010 වසරේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ සේවක සංඛ්‍යාව 2571 ක් වූ අතර එහි විස්තර පහත දැක්වේ.

කාණ්ඩය	2009	2010
විධායක නිලධාරීන්	72	62
ලිපිකරු හා සමාන්තර ශ්‍රේණිය	436	408
කණිෂ්ඨ හා සමාන්තර ශ්‍රේණිය	74	83
වෙක්රෝල් හා පුහුණු සේවකයින්	1989	1917
එකතුව	**2571**	**2470**

2010 වසරේ දී මණ්ඩලය පහත සඳහන් නව බඳවා ගැනිම් කරන ලදී.

ශ්‍රේණිය	තනතුර	සංඛ්‍යාව
	වෙක්රෝල් ලිපිකරුවන්	7
	පුහුණුවන ලිපිකරුවන්	3
	වෙක්රෝල් අලෙවි සහයකයින්	07
	රියදුරු (කොන්ත්‍රාත්)	1
	වෙක්රෝල් කම්කරුවන්	38
	එකතුව	**56**

2010 වසර තුළ ලබාදෙන ලද උසස්වීම්

	ශ්‍රේණිය	තනතුර	සංඛ්‍යාව
1	IV	කළමණාකරුවන්	2
	එකතුව		**2**

පහත සඳහන් විශ්‍රාම ගැනීම් හා ඉල්ලා අස්වීම් 2010 වසර තුල දී සිදුවිය .

	ශ්‍රේණිය	තනතුර	සංඛ්‍යාව
1	III	සහකාර සාමාන්‍යාධිකාරී	1
	IV	කළමණාකරු (අලෙවි)	1
	IV	කළමණාකරු	1
3	VI	සහකාර කළමණාකරු	1
4		ලිපිකරු	9
6		ශ්‍රේත්‍ර නිලධාරී	5
11		රියදුරු	3
	එකතුව		**21**

9 . 2010 වර්ෂය තුළ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ භෞතික ප්‍රගතිය

9 .1 පශු සම්පත් ක්‍රියාකාරකම්

9 .1.1 එළ ගවයින්

9 .1.1.1 ගවයින් ප්‍රමාණය

හේතුන් වුයේ වඳ හා අනෙකුත් ගවයින්ය. එළදෙනුන් 3430 ක් මුළු ප්‍රමාණයට ඇතුලත් වන අතර ඉන් 1519 ක් කිරෙහි සිටින එළදෙනුන් ය . ගව සංඛ්‍යාවෙන් වැස්සියන් ගණන 3634 කි. පසු ගිය වසරට වඩා ගව සංඛ්‍යාව අඩු වීමට ප්‍රධාන හේතු වූයේ අතිරේක මරණ හා මළ උපත් නිසා ය. කෙසේ වෙතත් තත්ත්වය දැනට පාලනය කර ඇත .

එළ ගවයින් සංඛ්‍යාව



9 .1.1.2 **කිරි නිෂ්පාදනය**

සමාලෝචිත වර්ෂය තුළ දී කිරි නිෂ්පාදනය ලීටර මිලියන 3.2 ක් වූ අතර වාර්ෂික ඉලක්ක ගත නිෂ්පාදනය වූ ලීටර මිලියන 4.0 සාපේක්ෂව 80%ක සාධනයකි . පසු ගිය වසර හා සසඳන කළ කිරි නිෂ්පාදනය එම මට්ටමේ ම වාගේ පැවැතිණ .



9 .1.1.3 උපත් හා මරණ

වර්ෂයේ ඉලක්ක ගත 2902 ක උපත් ප්‍රමාණය හා සසඳන විට වර්ෂය තුළ සිදු වූ උපත් ප්‍රමාණය 2613 කි. මෙය පසු ගිය වසර හා සසඳන විට උපත් 48 ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

සමාලෝචිත වර්ෂය තුළ දී ගවයින්ගේ මරණ අනුපාතය 6.5 % සිට 7.5 % දක්වා වැඩි වි ඇති බව පෙන්නුම් කරයි .



එළ ගව උපත්



එළ ගව මරණ්

9 .1.1.4 නිකුත් කිරී ම්

වාර්ෂික ඉලක්කය වූ 717 සහ 646 ක ප්‍රමාණයට සාපේක්ෂව අභිජනනය සඳහා මණ්ඩලය ජනතාවට පිළිවෙලින් ගැහැණු සතුන් 482 හා පිරිමි සතුන් 462 ක් නිකුත් කරන ලදී . අභිජනනය සඳහා වස්සන් සඳහා පැවැති ඉල්ලුම මේ වසරේ දී අඩු වීමක් දක්නට ලැබුණි.

අභිජනනය සඳහා එළ ගවයින් (පිරිමි හා ගැහැණු සතුන්) නිකුත් කිරීම



එළ ගවයින් අභිජනනය සඳහා නිකුත් කිරීම

9 .1.2 මී ගවයින්

9 .1.2.1 මී ගවයින් සංඛ්‍යාව

මී ගවයින් 2149 ක් වූ ඉලක්කයට සාපේක්ෂව 2010 දෙසැම්බර් අවසානය වන විට මී ගවයින් සංඛ්‍යාව 2409 ක් විය. මෙය පෙර වර්ෂය හා සසඳන විට මී ගවයින් සංඛ්‍යාවෙහි 218 ක වැඩි වීමක් දක්නට ලැබුණි. කිරෙහි සිටින දෙණුන් 442 ක් ඇතුළුව 935 ක දෙනුන් සංඛ්‍යාවක් සිටින අතර වැස්සියන් 1092 ක් ද සිටිති.



එළ ගව උපත්

9 .1.2.2 කිරි නිෂ්පාදනය

සමාලෝචිත වර්ෂය තුළ දී වාර්ෂික ඉලක්ක ගත නිෂ්පාදනය වූ කිරි ලීටර මිලියන 0.81 ට සාපේක්ෂව කිරි ලීටර මිලියන 0.68 ක් නිෂ්පාදනය කිරීමට හැකි වීණි. මෙය පෙර වර්ෂය හා සසඳන විට මී ගව කිරි නිෂ්පාදනය 11% කින් වැඩි වී ඇති බව පෙනී යයි.



මී ගව කිරි නිෂ්පාදනය(ලීටර මිලියන)

9 .1.2.3 උපත් හා මරණ

සමාලෝචිත වර්ෂය තුළ දී උපත් ප්‍රමාණය 642 ක් විය. වර්ෂය සඳහා ඉලක්ක ගත උපත් ප්‍රමාණය 645 කි. ඒ අනුව 99.5% ක ප්‍රගතියක් ලබා ගැනීමට මණ්ඩලය සමත් විණි

මී ගවයින්ගේ සමස්ථ මරණ අනුපාතය පසු ගිය වසරේ 11 % සිට මෙම වසරේ දී එය 9% දක්වා අඩු වී ඇති බව වාර්තා පෙන්නුම් කරයි.



මී ගව උපත්



මී ගව මරණ

9 .1.2.4 නිකුත් කිරීම්

මණ්ඩලයේ ගොවිපලවල් වල ප්‍රශස්ථ ගව සංඛ්‍යාවක් පවත් ගෙන යාම සඳහා 2010 වර්ෂය තුළ දීද මී ගව වැස්සියන් නිකුත් කිරීම සීමා කරන ලදී. වසර සඳහා ඉලක්ක ගත 80 සහ150 ට සාපේක්ෂව පිළිවෙළින් වැස්සියන් 54 ක් සහ වස්සන් 156 ක් සමාලෝචිත වර්ෂය තුළ දී අභිජනන කාර්යයන් සඳහා ජනතාව වෙත නිකුත් කරන ලදී.



අභිජනනය සඳහා මීගව නිකුත් කිරීම්

9 .1.3 කුකුළන්

9 .1.3.1 කුකුළන් අභිජනනය

බ්‍රොයිලර් කුකුළු පැටව් නිෂ්පාදනය

සමාලෝචිත වර්ෂය තුළ දී බ්‍රොයිලර් කුකුළු පැටව් නිෂ්පාදනය මිලියන 1.8 ක් වූ අතර එය ඉලක්ක ගත වාර්ෂික නිෂ්පාදනය වන මිලියන 2.0 ට සාපේක්ෂව 90 % ක ප්‍රගතියක් පෙන්නුම් කරයි. පසු ගිය වසර හා සසඳන කළ බ්‍රොයිලර් කුකුළු පැටව් නිෂ්පාදනය එම වර්ෂයේ නිෂ්පාදනයට ආසන්න වශයෙන් සමානව පවතී.



බ්‍රොයිලර් කුකුළ් පැටව් නිෂ්පාදනය

බිත්තර දමන පැටවුන් නිෂ්පාදනය

බිත්තර දමන කිකිළි පැටවුන් නිෂ්පාදනය කරන ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් එකම ගොවිපල මාරවිල පිහිටි ගොවිපලයි. මෙහි ෂේවර් 579 වර්ගයේ මව් සතුන් නඩත්තු කරනු ලැබේ. සමාලෝචිත වර්ෂය තුළ දී බිත්තර දමන පැටවුන් නිෂ්පාදනය මිලියන 1.0 ක් වුණි . වසර සඳහා ඉලක්ක ගත නිෂ්පාදනය වූයේ පැටවුන් මිලියන 0.75 කි . එය 127% ප්‍රගතියකි. පසු ගිය වසර හා සසඳන කළ බිත්තර දමන කිකිළි පැටවුන් නිෂ්පාදනය 70% කින් වැඩිවීමක් පෙන්නුම් කරන අතර මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2009 වසර තුලදී මෙම ලේයර් මව් සතුන් ගේ ආනයනයේ වැඩිවීමක් තිබුණ බැවිණි.



බිත්තර දමන කිකිළි පැටවුන් නිෂ්පාදනය

9 .1.3.2 වාණිජමය කුකුලන්

වාණිජමය බිත්තර නිෂ්පාදනය

2010 වසරේ බිත්තර මිලියන 1.1 ක් නිෂ්පාදනය කරමින් 110% ක් ප්‍රගතියක් පෙන්නුම් කළ අතර වාර්ෂික ඉලක්කය වුයේ බිත්තර මිලියන 1.0 ක් පමණි .

වාණිජ බිත්තර නිෂ්පාදනය

වාණිජමය බ්‍රොයිලර් නිෂ්පාදනය

2010 වසරේ වාර්ෂික ඉලක්කය වූ සතුන් 11,400 ට සාපේක්ෂව නිෂ්පාදනය සතුන් 7114 ක් විය. මෙයට ප්‍රධාන හේතුව වූයේ අධික නිෂ්පාදන පිරිවැය නිසා සියළු ව්‍යාපෘතීන් වල ක්‍රියාකාරකම් අඩු කිරීමයි.



වාණිජමය බ්‍රොයිලර් නිෂ්පාදනය

9 .1.4 ඌරන්

මණ්ඩලයේ ගොවිපලවල ඌරන් ඉලක්ක ගත ප්‍රමාණය 214 වුවත් පැවැති ඌරන් සංඛ්‍යාව 202 ක් විය. 2010 වසරේ දී ඌරු පැටවුන් සඳහා වූ ඉල්ලුම වැඩි වූ හෙයින් මේ වසරේ දී ඌරන් අභිජනනය වැඩි කරන ලදී . ඌරු පැටවුන් බිහි කිරීමේ අනුපාතය 1.5 % ක් වූ අතර ඉලක්ක ගත අනුපාතය 2.1 % කි.



මුළු ඌරන් සංඛ්‍යාව

9 .1.4.1 ඌරු පැටවුන් නිකුත් කිරීම

වාර්ෂික ඇස්තමේන්තුගත ප්‍රමාණය වූ 3531 කට සාපේක්ෂව ඌරු පැටවුන් 3328 ක් අභිජනනය සඳහා නිකුත් කරන ලදී . මේ වසරේ අභිජනනය සඳහා නිකුත් කළ ඌරු පැටවුන් සංඛ්‍යාව පසු ගිය වසර හා සසඳන කළ 82% ක වැඩිවීමක් දක්නට ලැබේ.



අභිජනනය සඳහා ඌරන් නිකුත් කිරීම

9 .1.5 එළුවන්

සමාලෝචිත වර්ෂය අවසානයේ දී සිටි එළුවන් සංඛ්‍යාව 1454 ක් වූ අතර එය පසු ගිය වසරේ 1656 ක් විය. මහබෙරියතැන්න ගොවිපලේ පැටවුන් බිහි කිරීමේ අනුපාතය අඩු වීමත් අධික ලෙස සතුන් රැලෙන් ඉවත් කිරීමට සිදු වීමත් මෙම අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. ඇස්තමේන්තුගත එළු දෙනුන් ප්‍රමාණය වු 863 කට සාපේක්ෂව දෙසැම්බර් මස අවසානයේ දී සිටි එළු දෙනුන් සංඛ්‍යාව 582 කි.



මුළු එළුවන් සංඛ්‍යාව

9 .1.5 .1 අභිජනනය සඳහා නිකුත් කිරීම

ඉලක්ක ගත 292 ක ප්‍රමාණයට සාපේක්ෂව 2010 වසරේ දී එළුවන් 218 ක් අභිජනනය සඳහා නිකුත් කරන ලදී . එළු අභිජනන ගොවිපල වල එළු පැටවුන් බිහි කිරීමේ අනුපාතය අඩු වීම මෙම ඉලක්ක ලඟා නොවීමට හේතුය.



අභිජනනය සඳහා එළුවන් නිකුත් කිරීම

9 .1.5 .2 එළු කිරි නිෂ්පාදනය

බෝපත්තලාව හා මහබේරියතැන්න ගොවිපල වල එළු කිරි නිෂ්පාදනයේ යෙදී අතර මෙම ගොවිපල වල වාර්ෂික ඇස්තමේන්තුගත ප්‍රමාණය වු කිරි ලීටර 30,686 ට සාපේක්ෂව කිරි ලීටර 13,358 ක් නිෂ්පාදනය කරන ලදී . මහබේරියතැන්න ගොවිපලේ පැටවුන් බිහි කිරීමේ අනුපාතය පහල තත්තවයක පැවතීම මෙයට හේතු විය.



එළු කිරි නිෂ්පාදනය (ලීටර මිලියන)

9 .1.6 බැටළුවන්

2010 දෙසැම්බර් මුළු එකතුව ඉලක්ක ගත 2671 ට සාපේක්ෂව 3043 ක වැඩි වීමක් පෙන්නුම් කරයි. මුළු බැටළු දෙනුන් සංඛ්‍යාව ඉලක්ක ගත 1278 ට සාපේක්ෂව 1389 ක් විය.



බැටළුවන් සංඛ්‍යාව

9 .1.6 .1 උපත්

2010 වසර තුල දී බැටළුවන්ගේ උපත් සංඛ්‍යාව 1314 ක් වූ අතර ඉලක්ක ගත සංඛ්‍යාව වන 1420 ට සාපේක්ෂව මෙය 93% ක ප්‍රගතියක් පෙන්නුම් කරයි.



බැටළු උපත්

9 .1.6 .2 අභිජනනය සඳහා නිකුත් කිරීම

සමාලෝචිත වර්ෂය තුළදී ඉලක්ක ගත සංඛ්‍යාව වන 596 ට සාපේක්ෂව අභිජනනය සඳහා බැටළුවන් 123 කු ජනතාව වෙත නිකුත් කරන ලදී. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් ගොවිපල වල බැටළුවන් තොග වැඩි කර ගැනීමේ අරමුණින් බැටළුවන් නිකුත් කිරීම සීමා කිරීම නිසා ඉලක්ක ලගා කර ගැනීම අඩු වීමට හේතු විය.



අභිජනනයට බැටළුවන් නිකුත් කිරීම

9 .1.7 ගොවි පුහුණු වැඩ සටහන්

ඉලක්ක ගත වාර්ෂික වැඩ සටහන් 106 ට සාපේක්ෂව 2010 වසර තුල දී රජවැල්ල දිගන පිහිටි මැද රට පශු සම්පත් සංවර්ධන මධ්‍යස්ථානයේ දී පුහුණු වැඩ සටහන් 108 ක් පවත් වන ලදී . මෙම කාලය තුල දී ගොවීන් 3597 ක් පුහුණු කරන ලදී . වාර්ෂික ඉලක්කය වූයේ 3816 කි. පසු ගිය වසර හා සසඳන කළ මෙමගින් ප්‍රගතිය අඩු වීමක් දක්නට ලැබුන අතර මෙයට හේතු වූයේ 3 දින නේවාසික වැඩ සටහන් සඳහා අඩු ඉල්ලුමක් පැවතීම් නිසාත් සමහර ආයතනවල වාර්ෂික අයවැය සඳහා වෙන් කරන ලද මුදල් නොලැබීමේ හේතුවෙන් එකී ආයතනවලට වෙන් කරන ලද වැඩ සටහන් වලට නොපැමිණීම යනා දි හේතුන් නිසාය.



ගොවි පුහුණු වැඩ සටහන්

9 .2 පොල් වගාව හා එහි කාර්යය සාධනය

9 .2.1 පොල් නිෂ්පාදනය

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ සාමාන්‍ය වාර්ෂික පොල් නිෂ්පාදනය ගෙඩි මිලියන 20-22 ක් පමණ වේ. පොල් වගාවෙන් 60 % ක් පමණ වයස්ගත වීම මෙයට හේතුවයි. මෙම තත්ත්වය සිත්හි තබාගෙන සෑම වසරකම අක්කර 300-400 ක් පමණ පොල් නැවත වගා කරනු ලැබේ. මාළු පොල් සඳහා පැවැති හොඳ මිළ නිසා කොප්පරා නිෂ්පාදනය පහත වැටුණි .

පොල් නිෂ්පාදනය මිලියන 22.6 ක ඉලක්කයට සාපේක්ෂව 91% ක ප්‍රගතියක් ලගා කර ගනිමින් 2010 වසරේ පොල් නිෂ්පාදනය ගෙඩි මිලියන 20.6 ක් ලබා ගැනීමට මණ්ඩලය සමත් විය.



පොල් නිෂ්පාදනය

10. මුල්‍ය ප්‍රකාශනය

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය 2009 වසරේ රුපියල් මිලියන 24.56 ක ලාභයට සාපේක්ෂව 2010 වසරේ රුපියල් මිලියන 176.4 ක ලාභයක් පෙන්නුම් කර ඇත. මෙම ලාභ වැඩි වීමට හේතුව පොල් නිෂ්පාදනය වැඩි වීම, නැවුම් කිරි විකිණීම, පශු සම්පත් අගයන් තක්සේරු කිරීම සමග වඩා හොඳ මුල්‍ය කළමණාකාරිත්වයයි. ඒකාබද්ධ ලාභාලාභ ගිණුම සහ ශේෂ පත්‍රය ඇමුණුමේ ඇත.

පිරිවැටුම

සමාලෝචිත වර්ෂය තුළ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ මුළු පිරිවැටුම රුපියල් මිලියන 1,099,722,297 ක් වූ අතර පසු ගිය වසරේ එය රුපියල් මිලියන 889,769,026 ක් විය.

සංචිත

2010/12/31 දින වන විට මණ්ඩලයේ ප්‍රාග්ධන සංචිත ප්‍රමාණය රුපියල් 131,884,428/- ක් වූ අතර 2009/12/31 දින වන විට එය රුපියල් මිලියන 132,599,971 ක් විය.

ගොවි භාරකාර අරමුදල් ණය

දැනට ණය ශේෂය රු. 102,600,000/- කි.

11. පොදු

සමාලෝචිත වර්ෂය තුළ සියළුම ක්‍රියාකාරකම් වල ඵලදායිතාවය වැඩි කිරීම සඳහා ගත හැකි සියළු ක්‍රියා මාර්ග ගන්නා ලදී. පසු ගිය වසර වල මෙන්ම මේ වසරේ ද මණ්ඩලයේ මුල්‍ය තත්ත්වය වඩා යහපත් වූ අතර ඊට ඉහල පොල් නිෂ්පාදනය, නැවුම් කිරි අලෙවිය ඉහල යාම, අභිජනනය සඳහා ගවයින් නිකුත් කිරීම ඉහල යාම සහ පොල් සඳහා හොඳ මිලක් පැවතීම ආදිය හේතු විය. වියදම් පාලනයේ ඇති වූ වර්ධනය ද මණ්ඩලයේ මුල්‍ය තත්ත්වය වඩා හොඳ තෘප්තිමත් මට්ටමකට ගෙන ඒමට උපකාරි විය. සමාලෝචිත වර්ෂය තුළ නැවුම් කිරි බෙදා හැරීමේ වැඩසටහන තවදුරටත් ව්‍යාප්ත කරන ලද අතර මෙය කිරි සඳහා වඩාත් යහපත් මිලක් ලබා දුන් අතර එමගින් ආදායමේ සැලකිය යුතු වැඩි වීමක් සිදු විය.

12. නිෂේධක

මණ්ඩලයේ ගොවිපලවල කෘෂිකාර්මික හා පශු සම්පත් ආශ්‍රිත ක්‍රියාකාරකම් ඒකාබද්ධ පදනමක් මත සිදු කරනු ලබයි. ගවයින් සඳහා වූ තණබිම් ප්‍රමාණය සීමාසහිත වූ අතර , මෙය ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ප්‍රශස්ථ නිෂ්පාදන මට්ටමට අහිතකර ලෙස බලපෑවේය. තවද වර්තමානයේ සිටින ගවයින්ගේ පහල මට්ටමේ ජාන තත්ත්වය මණ්ඩලයේ කිරි නිෂ්පාදනයට අහිතකර ලෙස බලපෑමට රුකුලක් විය.

සමාලෝචිත වර්ෂය තුළ පශු සම්පත් වල ආහාර ද්‍රව්‍ය හා ඒවායේ අමු ද්‍රව්‍ය වල මෙන්ම, අනෙකුත් යෙදවුම් වන වැටුප්/ වේතන, ඉන්ධන, විදුලිය ආදියේ මිල ගණන් ඉහල යාම, ඉහල නිෂ්පාදන වියදමක් සඳහා හේතු වු අතර මේ නිසා ඉහත යෙදවුම් සඳහා වාර්ෂික ඇස්තමේන්තු වල කරන ලද මුදල් වෙන් කිරීම් ප්‍රමාණවත් නොවී ය.

ස්තුතිය

පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍ය ගරු ආරුමුගම් තොන්ඩමාන් මැතිතුමාට සහ පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ගරු එච්. ආර්. මිත්‍රපාල මැතිතුමාට අධ්‍යක්ෂ මණ්ඩලය තම අවංක ස්තුතිය පුද කරන අතර ඔවුන් ලබා දුන් මග පෙන්වීම සහ දිරි ගැන්වීම, අදළ වර්ෂය තුළ මණ්ඩලය සෞභාග්‍ය කරා රැගෙන ගියේ ය. සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ සංවර්ධනය සඳහා කැපවීමෙන් සහය දුන් ආයතනයේ සියළු මට්ටමේ සේවක සේවිකාවන්ට ද මණ්ඩලය තම හෘදයාංගම ස්තුතිය පුද කරයි.

මණ්ඩලයට විවිධාකාරයෙන් අගනා සහය ලබා දුන්, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තුමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තුමෙන්තුව, පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් සහ අනෙකුත් කාර්ය මණ්ඩලය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය සහ අනෙකුත් සියළු රේඛීය ආයතන මණ්ඩලය කිසිසේත් අමතක නොකරන අතර මේ සියළු දෙනාටම මණ්ඩලය තම කෘතඥතාවය පුද කරයි.

මූල්‍ය ප්‍රකාශන

විගණකාධිපති වාර්තාව 110

ආදායම් ප්‍රකාශනය 121

ශේෂ පත්‍රය 122

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 123

ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශනය 124

මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 125

ඒඑෆ්/ඩී/එන්එල්ඩීබී/එෆ්ඒ/2010 2011 සැප්තැම්බර් **22** දින

සභාපති,

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය.

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනතේ 23 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර සවිස්තරාත්මක වාර්තාවක් 2011 සැප්තැම්බර් 14 දින සභාපතිවරයාට ඉදිරිපත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මකකිරීම හා පවත්වාගෙනයාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුලත් වේ.

1.3 **විගණන විෂය පථය සහ මතය සඳහා පදනම.**

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුලත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය හා ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය හා ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳව සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් , මෙම වාර්තාවේ 2.2 ජේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වගකීම් බාරගන්නා බවට ප්‍රකාශයක් විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) විදේශ ගමන් වියදම් රු. 1,796,450 ක් අදාල වියදම් ගිණුමේ නොදක්වා දේශන හා සම්මන්ත්‍රණ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) පොළොන්නරුව ගොවිපලට අදාලව විභාගවන නඩුවේ රු.60,000 වන්දියක් ඉල්ලුම්කර ඇති නමුත් , ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි.

2.2.3 ගෙවියයුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2006 වර්ෂයේ සිට අක්‍රියව පවතින නියෝජිතයින් මගින් කිරි එකතු කිරීමේ කාර්යය සඳහා ලබා ගන්නා ලද ආපසු ගෙවියයුතු තැන්පතු මුදල වූ රු.385,450 ක් නිරවුල් කිරීමකින් තොරව ආපසු ගෙවියයුතු මුදලක් ලෙස දිගින් දිගටම ගිණුම්වල දක්වා තිබුණි.

(ආ) 2006, 2007 හා 2008 වර්ෂ වලදී තැරැව්කරුවන් මගින් පොල් අලෙවි කිරීමේදී ගෙවියයුතුව පවතින තැරැව් ගාස්තු මුදල වූ රු. 3,376,038 ක මුදලක් නිරවුල් නොකර පැවතුණි.

(ඇ) ණයහිමියන් 7 දෙනෙකුට අදාලව 2000 වර්ෂයේ සිට පැවත එන රු.2,106,984 ක ශේෂ නිරවුල් නොකර පැවතුණි.

(ඇ) 2005 වර්ෂයේ සිට පැවත එන පොළොන්නරුව ගොවිපලේ මුරකරුවන් 09 දෙනෙකුගේ වැටුප් වැඩිවීමකට අදාලව ගෙවිය යුතු රු.16,540 ක මුදලක් නිරවුල්කර නොතිබුණි.

(ඉ) 1992 වර්ෂයේදී මහා භාණ්ඩාගාරයෙන් ලබාගෙන තිබුණු රු.50,000,000 පොලී රහිත ණය මුදල දීර්ඝ කාලයක් තිස්සේ ගිණුම්වල දක්වා තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) පොළොන්නරුව ගොවිපලට අදාලව අවුරුදු 06 ක කාලයක සිට පැවත එන අයනොවන ණයගැති ශේෂවල වටිනාකම රු.168,264 ක් විය.

(ආ) කිරි ව්‍යාපෘතියට අදාලව ණයගැතියන් 13 දෙනෙකුගෙන් රු.418,511 ක මුදලක් අයකරගැනීමට 2008 වර්ෂයේ සිට අපොහොසත් වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දී කිරි අලෙවි සැල්වලින් ප්‍රධාන කාර්යාලය වෙත මුදල් භාරදීමේදී රු.49,500 ක මුදලක් අඩුවෙන් භාරදී ඇති නමුත් 2010 දෙසැම්බර් 31 දින වනවිටද එම මුදල අයකරගෙන නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දී ගොවිපල තුනක නිෂ්පාදිත කිරි, කිරි ව්‍යාපෘතිය වෙත භාරදීමේදී රු.67,679 ක් වටිනා කිරි ලීටර් 1977.7 ක් අඩුවෙන් භාරදී තිබුණු අතර එම මුදල් අයකරගෙන නොතිබුණි.

(ඉ) මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය වෙනුවෙන් රු.2,644,404 ක වියදමක් දරා තිබුණද එම මුදල ප්‍රතිපුරණයකරගෙන නොතිබුණි.

(ර) වසර 4කට වැඩි කාලයක් නිරවුල් නොවී පවතින ණයගැති ශේෂවල වටිනාකම රු 27,121,209 ක් විය. මෙයින් රු.මිලියන 12 ක් අයකරගැනීමට නඩු පවරා ඇති බව සභාපතිවරයා දැනුම් දී ඇත.

2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමැතිවීම නිසා එම විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

විෂයය	වටිනාකම	ඉදිරිපත් නොවූ සාක්ෂි
	රු.	
වෙළඳ ණයගැතියෝ	64,607,665	ශේෂ සනාථ කිරීම්
තැන්පතු	8,504,240	- එම -
ඉදිරියට ගෙවීම්	1,289,611	- එම -

සියලුම ගොවිපල සතු බැංකු මුදල්	6,088,042	(i) බැංකු ශේෂ සනාථ කිරීම් (ii) බැංකු ප්‍රකාශන
දියරකිරි ප්‍රචලිත කිරීමේ ව්‍යාපෘතිය	541,432	(i) අනුමත ඇස්තමේන්තු (ii) සැලැස්ම (iii) අයවැය ලේඛනය
ස්ථාවර වත්කම් විෂයයන් 8 ක්	496,540,715	(i) විස්තරාත්මක උපලේඛන (ii) භාණ්ඩ සමීක්ෂණ වාර්තා (iii) යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛන

2.2.6 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූලනොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

	නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම
(අ)	1971 අංක 38 දරන මුදල් පනතේ 16(2) (අ) හා (ආ) වගන්ති	බැංකු අයිරා ලබාගැනීමට පෙර භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගතයුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානයට අනුමැතියකින් තොරව රු.9,264,342 ක බැංකු අයිරා ලබාගෙන තිබුණි.සමාලෝචිත වර්ෂයේදී අයිරා පහසුකම් වෙනුවෙන් ගෙවා ඇති පොලිය රු.10,338,708 ක් විය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 757 (2) දරන මුදල් රෙගුලාසිය	ගොවිපලවල් හැර මණ්ඩලයේ ඉතිරි භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2011 මැයි 06 දින දක්වාම විගණකාධිපතිවෙත ඉදිරිපත්කර නොතිබුණි.

(ඇ) අංක පීඊඩී 12 හා 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	
5.2.5 ඡේදය	යාවත්කාලීන කරන ලද ආයතනයේ සමස්ත අනුමත අයවැය ලේඛනය විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.
6.5.1 ඡේදය	වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.
6.5.3 ඡේදය	මණ්ඩලය විසින් 2007 වර්ෂයේ සිට වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.
7.4.1 ඡේදය	සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු එකක් පමණක් පවත්වා තිබුණි.
8.3.8 ඡේදය	මණ්ඩලය විසින් බාහිර පාර්ශවයන් වෙත රු.3,144,990 ක් ආධාර වශයෙන් ලබාදී තිබුණි.
(ඈ) අංක සීඑස්ඒ/පී/40 හා 2006 ජනවාරි 04 දිනැති රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛයේ 2.4 ඡේදය	ගොවිපලවල් සතු වාහන 03 ක් විෂයය භාර අමාත්‍යාංශයට අනුමැතියකින් තොරව මුදාහැර ඒ සඳහා රු. 198,600 ක වියදමක් දරා තිබුණි.
(ඉ) අංක 353 (5) හා 2004 අගෝස්තු 31 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2 ඡේදය	වාහන කුලියට ගැනීමේදී මාසික කුලිය රු. 40,000 නොඉක්මවියයුතු වුවද ඊට පටහැනිව වාහන 04 ක් කුලියට ලබා ගෙන සීමාව ඉක්මවා සමාලෝචිත වර්ෂයේදී රු.520,690 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ර) අංක CSA/P/40 හා 2007 පෙබරවාරි 28 දිනැති රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛයේ 3 ජේදය	දේශිය සංචාරවලදී ආහාරපාන හා නවාතැන් වෙනුවෙන් ගෙවිය යුතු හෝටල් ගාස්තු ආයතනයේ වියදමින් නොදැරිය යුතු වුවද රු1,890,465 ක හෝටල් ගාස්තු මණ්ඩලයේ අරමුදලින් දරා තිබුණි.

3. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

3.1 මූල්‍ය සමාලෝචනය

3.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.176,463,447 ක ශුද්ධ ලාභයක් වූ අතර , ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු.24,561,427 ක් වූයෙන් , මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.151,902,020 ක වර්ධනයක් පෙන්නුම් කෙරේණ. ආදායම රු.209,953,271 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනය සඳහා මූලික වශයෙන් බලපා තිබුණි.

3.1.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් 1995 වර්ෂයේදී සමාගමක රු.15,995,170 ක මුදලක් ආයෝජනය කර තිබුණද සමාගම අලාභ ලැබීම හේතුවෙන් ලාභාංශ නිකුත් කිරීමක් සිදුකර නොතිබුණි. මෙම සමාගම දැනට ඈවර කිරීම සඳහා කටයුතු කර ඇති අතර, එකී සමාගමේ තක්සේරු ගාස්තු හා එහි සභාපතිගේ වැටුප හා විදේශ ගමන් වෙනුවෙන් එකතුව රු.1,291,250 ක් මණ්ඩලය විසින් දරා තිබුණි.

(ආ) මහබේරිය තැන්න ගොවිපල විකිණීමෙන් ලැබෙන මුදලින් ණය පියවීමේ කොන්දේසිය මත 2003 වර්ෂයේදී ගොවීන්ගේ භාරකාර අරමුදලින් රු.102,662,700 ණය මුදලක් ලබා ගෙන තිබුණි. මණ්ඩලය සතු කිසිදු ගොවිපලක් පුද්ගලීකරණය නොකරන ලෙස අමාත්‍ය මණ්ඩලය විසින් උපදෙස් ලබාදීම නිසා උක්ත ගොවිපල අලෙවි කිරීමක් සිදුනොකරන ලද අතර,ණය මුදලද නිරවුල් කර නොතිබුණි. මෙම ණය මුදල මූල්‍ය තත්වය යහපත් වූ විගස ගෙවීමට කටයුතු කරන බව සභාපති විසින් 2009 වර්ෂයේදී විගණනය වෙත දන්වා තිබුණද සමාලෝචිත වර්ෂයේදීද ,එම ණය මුදල නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

3.2 මෙහෙයුම් සමාලෝචනය

3.2.1 ගොවිපල ලාභදායකත්වය

ඉකුත් වර්ෂයේදී සහ සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් මණ්ඩලය විසින් පශු සම්පත් අභිජනන හා නිෂ්පාදිත ගොවිපලවල් 30 හා 32 ක් කළමනාකරණය කර ඇති අතර , පහත සඳහන් පරිදි ශුද්ධ ලාභ/අලාභ උපයා තිබුණු බව නිරීක්ෂණය විය.

	2010	2009
ලාභ උපයා තිබුණු ගොවිපල සංඛ්‍යාව	17	19
ඉපයු ශුද්ධ ලාභය (රුපියල්)	421,584,237	245,569,716
අලාභ ලබා තිබුණු ගොවිපලවල් සංඛ්‍යාව	15	11
ඉපයු ශුද්ධ අලාභය (රුපියල්)	80,861,214	79,994,261

3.3 අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ කටයුතුවලට පර්බාහිරවූ ගෘහස්ත කාර්යයන් සඳහා කම්කරුවන් යොදවා ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.220,526 ක වියදමක් දරා තිබුණි.

(ආ) මැතිවරණ කටයුතු සඳහා රු.127,286 ක වියදමක් දරා තිබුණි.

3.4 හඳුනාගත් පාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බෝපත්තලාව ගොවිපල වෙත භාරදී තිබුණු කිරි අලෙවිසැල් 03 ක් 2010 ජුනි වනවිට වසා දමා තිබුණු අතර එම අලෙවි සැල් 2010 මාර්තු සිට ජුනි දක්වා ලබා ඇති පාඩුව රු.100,587 ක් විය.

(ආ) බෝපත්තලාව ගොවිපල සතු වසා දමන ලද කිරිහල්වල 2010 ජුලි මාසය වනවිට තිබුණු රු.10,377 ක් වටිනා කිරි ලීටර් 296.38 ක් සම්බන්ධයෙන් ගොවිපල කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) විවිධ අනතුරු නිසා ජීවිත අහිමි වු වැලිකන්ද ගොවිපලේ සිටි වටිනාකම රු.79,380 ක් වු සතුන් 14 දෙනෙකු පොතෙන් කපාහැර තිබුණි.

(ඇ) ගොවීන්ගේ භාරකාර අරමුදලින් 2003 වර්ෂයේ ලබාගත් ණය මුදල නොගෙවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතුව පවතින පොලී මුදල රු 10,266,270 ක් විය.

(ඉ) ප්‍රධාන කාර්යාලීය කිරි ව්‍යාපෘතිය වෙත සපයන ලද බෝපත්තලාව ගොවිපලෙහි නිෂ්පාදිත රු.242,160 ක් වටිනා එළකිරි බෝතල් 4036 ක් නරක් වී තිබුණි.

(ඊ) බෝපත්තලාව ගොවිපලෙහි නිෂ්පාදිත කිරි ප්‍රධාන කාර්යාලයට යැවීමේදී 2010 මැයි මාසය දක්වා රු.202,020 ක් වටිනා දියරකිරි ලීටර් 5722ක් අඩුවීම් වලට හා නරක් වීම් වලට භාජනය වී තිබුණි.

(උ) කල් ඉකුත්වීමට ප්‍රථම නරක් වී ඇති ඔයාමඩුව ගොවිපලෙහි අලෙවි සැල් නිෂ්පාදන සඳහා මුදල් නොලැබීම නිසා රු.73,344 ක පාඩුවක් සිදුවී තිබුණි.

(ඌ) ගොවිපල නිෂ්පාදිත අලෙවිකිරීම සඳහා පිහිටුවා ඇති ඔයාමඩුව ගොවිපලට අයත් කිරි අලෙවි සැල් 14 ක් සමාලෝචිත වර්ෂයේ ලබා ඇති පාඩුව රු.641,476 ක් විය.

3.5 නිශ්කාර්ය වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1992 වර්ෂයේ බෝපත්තලාව ගොවිපලේ ස්ථාපිත කරන ලද සත්ව ආහාර ගබඩා කරන ටොන් 05 ක ධාරිතාවයකින් යුතු ජී.අයි.සිලින්ඩරාකාර ටැංකි 02 කිසිදු ප්‍රයෝජනයකට නොගෙන ස්ථාපිත කළ වර්ෂයේ සිට නිශ්කාර්යව පැවතුණි.

(ආ) පොළොන්නරුව ගොවිපලේ වර්ග අඩි 6,039ක ගාව ගාල් 07 ක්, වර්ග අඩි 5,940ක ගවගාල් 03 ක් හා විවිධ කාර්යයන් සඳහා භාවිතා කරන ලද ගොඩනැගිලි 09 දීර්ඝ කාලයක සිට පාවිච්චියට ගෙන නොතිබුණි.

(ඇ) පොළොන්නරුව ගොවිපල සතුව ගරා වැටුණු නිවාස 22 ක් පැවතුණු අතර ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) පරසන්ගස් වැව ගොවිපලෙහි 2007 වර්ෂයේ සිට පරිහරනය නොකර අත්හැර දමා විනාශ වෙමින් පවතින ගොඩනැගිලි සංඛ්‍යාව 11 ක් වූ අතර මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.6 **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) අනුමත කාර්ය මණ්ඩලයට පරිබාහිරව උපදේශකයින් 9 දෙනෙකු බඳවා ගෙන සමාලෝචිත වර්ෂයේදී රු.475,407 ක දීමනාවක් ගෙවා තිබුණි.

(ආ) මෙම බඳවා ගැනීම් සඳහා සහ කාර්ය මණ්ඩල සංයුතිය සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ සහ වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

3.7 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2009 ඔක්තෝබර් 06 දිනැති ලිපිය අනුව මහා භාණ්ඩාගාරයට ගෙවියයුතු රුපියල් මිලියන 10 ක ලාභාංශය ගෙවා නොතිබුණි.

(ආ) `` අවිධිමත් උසස්වීම් - සහකාර සාමාන්‍යාධිකාරී `` යන මැයෙන් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ගේ 2009 ජුලි 27 දිනැති ලිපිය මගින් දන්වා ඇති පරිදි එම උසස් කිරීම් විධිමත් කර නොතිබුණි.

(ඇ) ප්‍රධාන කාර්යාල අලෙවිසැලේ 2009 වර්ෂයෙහි මාස දෙකක් ඇතුලත සිදුවූ රු.900,000 ක භාණ්ඩ හා මුදල් අඩුවීම සම්බන්ධයෙන් අදාල පුද්ගලයින් ගෙන් අයකර නොතිබුණි.

(ඈ) කන්තලේ බඩඉරිඟු ව්‍යාපෘතියෙහි ලදුපත් නිකුත් වී ඇති නමුත් නොලැබුණු මුදල වූ රු.30,250 අයකිරීම සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබුණි

(ඉ) 2008 දෙසැම්බර් මස බීජ බඩ ඉරිඟු අලෙවි කර ලබාගත් රු.79,750 ක මුදල් අයථා ලෙස පරිහරණය සම්බන්ධයෙන් අදාල නිලධාරීන්ට එරෙහිව කිසිදු පියවරක් ගෙන නොතිබුණි

(ඊ) දැදුරු ඔය වාරිමාර්ග ව්‍යාපෘතිය සඳහා නිකවැරටිය ගොවිපලින් අක්කර 04 ක් නිදහස් කිරීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම, එම ඉඩම් ප්‍රමාණය නිත්‍යානුකූලව පවරා දීම හා ස්ථාවර වත්කම් ලේඛනයන් ඉවත් කිරීම සිදුකර නොතිබුණි.

(උ) මණ්ඩලය සතු වාහන 04 ක් අමාත්‍යාංශය හා අමාත්‍ය කාර්ය මණ්ඩලය සඳහා මුදාහැර මණ්ඩලය විසින් රු. 624,670 ක අලුත්වැඩියා වියදම් දරා තිබුණි.

3.8 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර සැලකිය යුතු විචලනයන් වුයෙන් , අයවැය ලේඛනය සඵල කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

4. පද්ධති සහ පාලන

විගණනයේදි නිරික්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර මණ්ඩලයේ අවධානය සඳහා යොමුකරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ස්ථාවර වත්කම් පාලනය

(ආ) හානි හා පාඩු කපාහැරීම්

(ඇ) නිශ්කාර්ය වත්කම්

(ඇ) සේවක කළමනාකරණය

(ඉ) මුල්‍ය කළමනාකරණය

(උ) තොග පාලනය

(ඌ) නිරවුල් කලයුතු ශේෂ

එච්.ඒ.එස්.සමරවීර

විගණකාධිපති.

ආදායම් ප්‍රකාශනය

2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	සටහන්	2010.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය රු.	2009.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය රු.
ආදායම්	5	1,099,722,297	889,769,026
විකුණුම් පිරිවැය		(797,818,226)	(718,381,807)
දළ ලාභය		301,904,071	171,387,219
වෙනත් මෙහෙයුම් ආදායම්	6	19,625,364	19,562,865
		321,529,435	190,950,084
රාජ්‍ය ප්‍රදාන		5,125,000	13,661,559
		326,654,435	204,611,643
බෙදාහැරීමේ පිරිවැය		(3,574,785)	(4,045,274)
පරිපාලන වියදම්		(107,912,043)	(114,209,277)
වෙනත් වියදම්		(10,656,712)	(24,498,613)
මෙහෙයුම් වලින් ලාභය	7	204,510,895	61,858,480
මූල්‍ය පිරිවැය		(28,695,065)	(37,772,053)
බදුවලට පෙර ලාභය / (අලාභය)		175,815,830	24,086,427
වත්කම් ඉවත් කිරීමෙන් ලාභ		3,129,328	475,000
බදු	8	(2,481,711)	-
වර්ෂයට අදාළ ලාභය		**176,463,447**	**24,561,427**

ශේෂ පත්‍රය

2010 දෙසැම්බර් 31 දිනට	සටහන්	31.12.2010. රු.	31.12.2009 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල පිරියත හා උපකරණ	10	499,473,587	486,315,665
වෙනත් වත්කම්	11	481,819,391	408,733,500
		981,292,978	895,049,165
පරිපාලිත සමාගම්වල ආයෝජනය	9	15,995,171	15,995,171
ජංගම වත්කම්			
තොග		168,272,292	130,782,456
වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු ශේෂ		145,382,142	115,596,084
මුදල් හා මුදල් සමාන වටිනාකම්		50,489,106	74,556,881
		364,143,540	320,935,421
මුළු වත්කම්		**1,361,431,689**	**1,231,979,757**
ස්කන්ධය හා වගකීම්			
ප්‍රාග්ධනය හා සංචිත			
ප්‍රාග්ධනය		576,587,649	576,587,649
සංචිත		153,857,557	154,573,100
ලාභාලාභ ගිණුම		(41,211,528)	(217,674,975)
		689,233,678	513,485,774
වක්‍රීය අරමුදල		37,500,000	37,500,000
ජංගම නොවන වගකීම්			
දිගුකල් බැරකම්	12	117,863,653	134,901,135
විලම්බිත බැරකම්	14	166,466,691	154,442,001
භාණ්ඩාගාරයෙන් ලද ණය	13	50,000,000	50,000,000
		334,330,344	339,343,136
ජංගම වගකීම්			
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂ	15	249,065,881	223,481,475
වර්‍ෂයක් තුළදී ගෙවිය යුතු දිගුකල් ණය		17,037,444	17,037,444
බැංකු අයිරාව		34,264,342	101,131,928
		300,367,667	341,650,847
මුළු ස්කන්ධය හා වගකීම්		**1,361,431,689**	**1,231,979,757**

අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරන ලදි.

සභාපති

ගණකාධිකාරී

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2010 දෙසැම්බර් 31 දිනට	2010 රු.	2009 රු.
මෙහෙයුම් ක්‍රියාවලින් ජනනය වූ මුදල්		
වර්‍ෂයට අදාළ ශුද්ධ ලාභය / (අලාභය)	176,463,447	24,561,427
මුදල් ප්‍රවාහයට බලනොපාන අයිතමයන් සඳහා ගැලපීම		
දේපල පිරියත හා උපකරණ විකිණීමෙන් අලාභය / (ලාභය)	(3,129,328)	-
ක්‍ෂයවීම්	32,218,289	62,655,033
විශ්‍රාම පාරිතෝෂික සඳහා වෙන්කිරීම	29,906,056	6,131,944
බොල්ණය සඳහා වෙන්කිරීම	13,503,564	9,022,049
පොලී	26,817,840	36,661,621
ප්‍රසාද දිමනා සඳහා වෙන්කිරීම	8,206,000	6,000,000
කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ක්‍රියාවලින් ජනනය වූ මුදල්	283,985,868	145,032,074
කාරක ප්‍රාග්ධනයේ වැඩිවීම / (අඩුවීම)		
තොග (වැඩිවීම) / අඩුවීම	(37,489,836)	23,555,490
වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂයන්ගේ (වැඩිවීම) / අඩුවීම	(40,281,389)	8,424,636
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂ (වැඩිවීම) / අඩුවීම	17,378,406	(4,025,237)
මෙහෙයුම් ක්‍රියාවලින් ශුද්ධ මුදල්	223,593,049	172,986,962
ගෙවූ පොලී	(26,817,840)	(36,661,621)
ගෙවූ ප්‍රසාද දීමනා	(17,881,366)	(14,203,015)
ගෙවූ බදු	(3,008,233)	(5,039,400)
මෙහෙයුම් ක්‍රියාවලින් ජනනය වූ ශුද්ධ මුදල්	175,885,609	117,082,926
ආයෝජන ක්‍රියවලින් ශුදධ මුදල් ප්‍රවාහ		
දේපල පිරියත හා උපකරණ මිලදී ගැණුම් (ශුද්ධ)	(45,608,571)	(16,818,972)
වෙනත් වත්කම්වල ආයෝජනය	(73,085,891)	(71,873,443)
දේපල පිරියත හා උපකරණ විකිණීමෙන් ලද ප්‍රමාණයන්	3,361,689	-
	60,552,836	28,390,511
මූල්‍ය ක්‍රියාවලින් මුදල් ප්‍රවාහ		
රාජ්‍ය ප්‍රදාන ලැබීම්	(715,543)	(13,161,559)
ශුද්ධ ණය වෙනස්වීම්	(17,037,482)	(17,141,610)
මුදල් සහ මුදල් සමාන වටිනාකම්වල (අඩුවීම) වැඩිවීම	42,799,811	(1,912,658)
වර්‍ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමාන වටිනාකම්	(26,575,047)	(24,662,390)
වර්‍ෂය අවසානයේ දී මුදල් හා මුදල් සමාන වටිනාකම්	16,224,764	(26,575,047)

2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා	ප්‍රාග්ධනය	ප්‍රාග්ධන සංචිත	අයහාර සංචිත	ලාභාලාභ ගිණුම	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.
2010 ජනවාරි 01 දිනට ශේෂය	576,587,649	132,599,971	21,973,129	(217,674,975)	513,485,774
ප්‍රදානයන් ලැබීම්		4,508,928			4,508,928
ප්‍රදානයන් හායනය		(5,224,470)			(5,224,470)
වර්ෂයට අදාළ ශුද්ධ ලාභය	-		-	176,463,447	176,463,447
2010 දෙසැම්බර් 31 දිනට ශේෂය	576,587,649	131,884,428	21,973,129	(41,211,528)	689,233,678

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

2010 දෙසැම්බර් 31 දිනට

1. සංයුක්ත තොරතුරු

1.1. පොදු

1972 අංක 11 දරණ රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනත යටතේ ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය 1973 දී ස්ථාපිත කරන ලදඅතර, ක්ෂේත්‍ර කටයුතු ආරම්භ කරන ලද්දේ 1974 දීය. වර්තමානයේ ජාතින පශු සම්පත් සංවර්ධන මණ්ඩලය පශු සම්පත් හා පොල් වගාව පවත්වාගෙන යාමට පුහුණු මධ්‍යස්ථානයක් සමග එහි සම්පත් හා භෝග ඒකාබද්ධ ගොවිපලවල් 30 ක් පාලනය කරයි. මණ්ඩලයේ ලියාපදිංචි කාර්යාලය අංක 40, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05 ස්ථානයේ පිහිටා ඇත.
රටේ පශු සම්පත් දියුණු කිරීමට පශු / භෝග ඒකාබද්ධ ගොවිපල් ක්‍රමය සමග පශු සම්පත් අභිජනන ගොවිපල් පවත්වා ගෙන යාම මණ්ඩලයේ මූලික ක්‍රියාකාරකම් වේ.

1.2. උප හා උප සමාගම්

සීමාසහිත ශ්‍රී ලංකා ලිබියා කෘෂිකාර්මික හා පශු සම්පත් සංවර්ධන සමාගම් නිකුත් කල ප්‍රාග්ධනයෙන් 51% ක් මණ්ඩලය විසින් අත්කර ඇත. කොළඹ 02, නවම් මාවතේ, අංක 46/56 යන ස්ථානයේ එහි ලියා පදිංචි කාර්යාලය පිහිටා ඇත. කෘෂිකර්ම, පශු සම්පත් ලිබියාවට තේ අපනයන කිරීම පරීක්ෂාව සමාගම් ප්‍රධාන ක්‍රියාකාරකම් වේ.

මව් සමාගම වෙනුවෙන් අධ්‍යක්ෂකවරුන් සිවු දෙනෙකු පරිපාලන සමාගම් අධ්‍යක්ෂ මණ්ඩලයට පත්කරනු ලැබ ඇත.

2. ගිණුම් ප්‍රතිපත්ති

2.1. පොදු ප්‍රතිපත්ති

2.1.1 සකස් කිරීමේ පදනම

2010 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වර්ෂය සඳහා වූ ශේෂ පත්‍රය ආදායම් හා වියදම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශය අදාළ සටහන් හා ගිණුම් ප්‍රතිපත්ති අමුණා ඇත. එලෙස පිලියෙළ කර ඇති ගිණුම්වල ප්‍රමාණාත්මක කරුණු ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වේ.

ඉදිරිපත් කර ඇති මෙම මූල්‍ය ප්‍රකාශය ශ්‍රී ලංකා රුපියල් වලින් වන අතර, එය ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත.

2.1.2 සංසන්දනාත්මක තොරතුරු

ගිණුම් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් ඒකාකාරීව භාවිතා කර ඇති අතර, පෙර වර්ෂවල යොදාගත් සංසන්දනාත්මක අගයන් මෙම වර්ෂයේ ඉදිරිපත් කිරීමේ රටාවට අනුව නැවත ගැලපීමක් සිදුකර ඇත. කෙසේ වෙතත් ප්‍රාදේශීය සහකාර සාමාන්‍යාධිකාරීන් සහ පශු වෛද්‍යවරුන් වෙනුවෙන් දරන ලද වියදම් ප්‍රධාන කාර්යාලයේ වියදම් ලෙස පසුගිය වර්ෂවල දී පෙන්නුම් කර ඇත. විගණකාධිපතිගේ නිර්දේශයන්ට අනුව එම වියදම සියලු ගොවිපල ගිණුම් ඒකකයන්ට විභජනය කර ඇත. මෙය ඔවුන් විසින් අදාළ වර්ෂය තුළ දී සපයන ලද සේවාවන්ට සමානව සිදුකර ඇත. පසුගිය වර්ෂවලට අදාළ ශේෂයන් ඒ අනුව ගැලපුම් කර ඇත.

2.1.3 අඛණ්ඩභාවය

අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය අඛණ්ඩව පවතින හා වතකම් දුවශීල කිරීමට අවශ්‍යතාවක් ඇතිනොවන එමෙන්ම මෙහෙයුම් නතර කිරීම අවශ්‍ය නොවන ආයතනයක් ලෙෂ සලකා ඇත.

2.1.4 උපචිත පදනම

යම් ගනුදෙනුවක් සහ වෙනත් සිද්ධියක් සිදුවූ විගස ඊට අදාළ මුදල් හෝ මුදල් වටිනාකම ලැබුණත් නැතත් හෝ ගෙවීම සිදුකලත් නැතත් එය සිදුවූ ගනුදෙනුවක් සේ හඳුනාගැනීම සිදුකරයි.

2.1.5 විදේශ විනිමය ගනුදෙනු

විදේශ විනිමය හුවමාරු ගනුදෙනු, අදාළ ගනුදෙනු සිදුවූ දිනයේ පැවති විදේශ විනිමය හුවමාරු මිල ගණන් අනුව ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කර වාර්තාවල සටහන් ගත කර ඇත.

2.1.6 විලම්බිත බදුකරණය

විලම්බිත වූ බදු බැරකමක් නොමැති, සමුච්චිත බදු අලාභ පවතින බැවින් ශේෂ පත්‍ර දිනට බදු බැරකමක් නොමැත.

2.1.7 එකතුකල වටිනාකම මත බදු

මණ්ඩලය එකතුකල වටිනාකම මත බදු ගෙවීමට යටත් වන අතර බදු සඳහා අදාළ වන අතර නීතිමය අවශ්‍යතා සපුරා ඇත.

2.1.8 **ආර්ථික සේවා ගාස්තු**

අදාළ අයභාර ආදායම් ආර්ථික සේවා ගාස්තු සඳහා යටත් වන අතර මේ වන විට සියලු ආර්ථික සේවා ගාස්තු ගෙවීම් මණ්ඩලය සිදුකර ඇත.

2.1.9 **විලම්බිත අයභාර වියදම්**

(a). පොල් ව්‍යාපාති

පොල් නැවත වගාව හා යටි වගාව සඳහා වියදම් සිටවීම් හා වාණිජ්‍යමය ඵල නෙලන කාලය ලෙස ගැනෙන වර්ෂ 07 ක කාලය තුළ ප්‍රාග්ධනික කරයි. වාණිජමය ඵල නෙලීම ආරම්භයේ සිට වර්ෂ 35 ක් තුළ මෙම වියදම් ලියා හරිනු ලැබේ.

(b). තෘණ සංවර්ධනය

තෘණ වගා වියදම් තෘණ සිටුවීමේ සිට කපන කාලය වූ මාස 05 ක කාලය සලකා ප්‍රාග්ධනිත කරනු ලබයි. එය වර්ෂ 04 ක් තුල කපාහැරීම සිදුකරනු ලැබේ.

2.2 **වත්කම් අගයකිරීම හා ඒවායේ මිණුම් පදනම**

2.2.1 **තොග**

කල් පැනගිය හා සෙමෙන් අලවි වන භාණ්ඩ වෙනුවෙන් නියමිත වෙන් කිරීම් කිරීමෙන් පසු භාණ්ඩවල පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු ප්‍රමාණයට තක්සේරු කර ඇත. ශුද්ධ උපලබ්ධි අගය යනු සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී භාණ්ඩ විකිණීමට හැකි මුදලින්, එම විකිණීම සිදුකිරීම සඳහා අවශ්‍ය කරන ඇස්තමේන්තු වියදම් සහ සම්පූර්ණ කිරීමට ඇස්තමේන්තු කල වියදම් අඩු කිරීමෙන් එළඹෙන අගයයි.

තොගය වර්තමානයේ පිහිටි ස්ථානයට හා තත්ත්වයට පත් කිරීම සඳහා දරන ලද පිරිවැය පහත සඳහන් සූත්‍රය පදනම් කරගෙන ගිණුම්ගත කර ඇත.

සතුන් (කුකුළන් හැර)
උදා. ගවයන්, මීහරක් ආදිය

පහත සඳහන් කරණු පදනම් කරගෙන අභිජනනය සඳහා වූ ෂතුන් මිල ගණන් යටතේ තක්සේරු කර ඇත.

1 ජීවබර
2 කිරි මුර ප්‍රමාණය
3 කිරි නිෂ්පාදනය
4 ගැබ්බර බර
5 ප්‍රවේණි - ජාන අගය

අනෙකුත් සතුන්

ජීවබර, ප්‍රවේණි අගය හා ගැබ්බර බව පදනම් කරගෙන බැටළුවන්, එළුවන්, ඌරන් හා හාවුන් ප්‍රමිති මිල ගණන් වලට තක්සේරු කර ඇත.

සියලුම රැළට නුසුදුසු සතුන් බර පදනම් කරගෙන ප්‍රමිති මිලට ඇස්තමෙන්තු කර ඇත.

(ii) අභිජනන හා වාණිජමය කුකුළන්

(අ) බිත්තර දමන කාණ්ඩ (බිත්තර දැමීම ආරම්භ වූ පසු)

පැටවුන්ගේ මිල හා විකිණීම සඳහා බිත්තර ලබා ගැනීමට ඇති කිකිළියන්ගේ බිත්තර දැමීම ආරම්භය දක්වා වූ වියදම බිත්තර දැමූ කාලයට අදාළ කොටස ලියා හැරීමෙන් පසුව වූ ඉතිරිය මත අගය කර ඇත.

(ආ**)** අභිජනන හා වාණජමය බිත්තර ලබා ගන්නා වැඩෙන කුකුල් කාණ්ඩ (බිත්තර දැමීම ආරම්භයට පෙර)

නියමිත දිනය දක්වා දරන ලද සත්‍ය වියදම මත අගය කර දක්වා ඇත.

(iii) අභිජනන බිත්තර (රක්කන බිත්තර)

පහත සඳහන් චක්‍රය භාවිතා කරමින් අභිජනන බිත්තර පිරිවැය මත තක්සේරු කර ඇත.

මුළු පිරිවැය, දෙසැම්බර් මාසයේ නිෂ්පාදිත රැක්කවිය හැකි බිත්තර ප්‍රමාණයෙන් බෙදීම.

සත්ත්ව ආහාරවල පිරිවැය සෘජු වේතන හා ක්ෂයවීම ඇතුලත් පොදු වියදම් මෙහි සඳහන් කර ඇති මුළු පිරිවැය යන්නට ඇතුළත් කර ඇත.

(iv) වාණිජමය බිත්තර

වාණිජමය බිත්තර අලෙවි සැලෙහි පසුව උපලබ්ධි වූ මිලට අගය කර ඇත.

(v) නොමේරූ බ්‍රොයිලර් සහ ලේයර් තොග
පිරිවැය මත තොග අගය කර ඇත.

(vi) ශීත කාමරවල ඇති බ්‍රොයිලර්
පසුව උපලබ්ධි වූ මිලට ශීතකාමරවල ඇති බ්‍රොයිලර් අගය කර ඇත.

(vii) පොල් හා කෘෂි නිෂ්පාදන
පසුව උපලබ්ධි වූ මිලට පොල් සහ කෘෂි තොග අගය කර ඇත.

(viii) පොල් කටු අඟුරු
පසුව උපලබ්ධි වූ මුදලින් 50% ක වටිනාකමට පොල් කටු අඟුරු අගය කර ඇත.

(ix) අනෙකුත්
පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි වූ අගයෙන් අඩු අගයට අනෙකුත් තොග අගය කර ඇත.

2.2.2 **වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු මුදල්**

වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු මුදල් ඒවායේ ඇස්තමේන්තු කළ උපලබ්ධි මිලෙන් බොල් හා අඩමාණ ණය අඩුකිරීමෙන් පසු විලඹෙන වටිනාකමට සටහන් කර ඇත.

2.2.3 **මුදල් හා මුදලට සමාන දෑ**

අත ඉතිරි මුදල්, ඉල්ලුම් තැන්පතු ඉතා ඉක්මනින් මුදල් බවට පත්කළ හැකි අයොජන, වටිනාකමේ සැලකිය යුතු අවදානමක් නොමැති මුදල් බවට පරිවර්තනය කළ හැකි හඳුනාගත් මුදල් යනාදිය මුදල් හා මුදල්ට සමාන දෑ වශයෙන් අර්ථ නිරූපණය කර ඇත.

2.2.4 **දේපල, පිරියත හා උපකරණ**

(අ). පිරිවැය
දේපල පිරියත හා උපකරණ වටිනාකම එහි පිරිවැය මිලෙන් සමුච්චිත ක්ෂය අඩුකර දක්වා ඇත.

(ආ). ප්‍රතිසංස්කරණ පිරිවැය
දේපල පිරියත හා උපකරණ අනාගත ආර්ථික ප්‍රතිලාභ ලබාගැනීමට හැකිවන පරිදි එහි මුල් ක්‍රියාකාරී තත්ත්වයෙන් පවත්වා ගෙන යාම සඳහා හෝ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා දරන ලද වියදම් එය දරන ලද අවස්ථාවේ වියදම් ලෙස සටහන් කර ඇත.

(ඇ) ක්ෂයවීම
ඉඩම් හැර දේපල පිරියත උපකරණ සඳහා සරල මාර්ග ක්‍රම භාවිතා කරමින් ක්ෂයවීම් කිරීම ගණනය කර ඇති අතර ප්‍රයෝජනවත් ජීවිත කාලය තුළ එකී පිරිවැය ලියා හැරීම සඳහා පහත සඳහන් ඇස්තමේන්තුගත වාර්ෂික ක්ෂය ප්‍රතිශතයන් ප්‍රයෝජනයට ගෙන ඇත.

	වාර්ෂික ක්ෂය ප්‍රතිශතයන්]
ගොඩනැගිලි	5
පිරියත හා යන්ත්‍රසූත්‍ර	10
ලීබඩු හා සවිකිරීම්	10
මාර්ග හා ප්‍රවාහන	20
කාර්යාල උපකරණ	20
මෝටර් වාහන	20
පශු සම්පත් මඩු ඇතුලත්ව ඉදිකිරීම් සැකිලි	20
වතු උපකරණ	25

(ඈ). පශු සම්පත් මඩු
පශු සම්පත් මඩු සඳහා කරන ලද වියදම එම වියදම දරන ලද වර්ෂය අගදී ප්‍රාග්ධනිත කර ඊළඟ වසර පහ තුලදී ලියා හරිනු ලැබේ.

2.2.5 **ආයෝජන**

(අ). දීර්ඝකාලීන ආයෝජන
දීර්ඝකාලීන ආයෝජන පිරිවැය මත පෙන්නුම් කර ඇත.

උප සමාගමේ ප්‍රාග්ධනයෙන් 51% ක කොටස් අත්කර ගැනිම සඳහා කරන ලද වියදම දිගුකාලීන ආයෝජනවල පිරිවැයයි.
(ගිණුම් සඳහා වූ අංක 02 සටහන බලන්න.)

2.2.6 **ඵල දරන වගාව**

වගාව ස්ථාපිත කිරීම සඳහා සහ වර්තමාන මූල්‍ය කාලපරිච්ඡේදයේ ඵල දරන අවධිය දක්වා වගාව ස්ථාපිත කිරීම සඳහා ගිය වියදම් ප්‍රාග්ධනිත කරන ලද අතර අදාල කාලපරිච්ඡේදය සඳහා ක්ෂයවීම් ලෙස ලියා හරින ලද ප්‍රමාණය අඩුකොට දක්වා ඇතග

වගකීම් හා වෙන්කිරීම්

2.3.1 **විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්**

(අ) නියමිත ප්‍රතිලාභ සැළසුම් - පාරිතෝෂික

පාරිතෝෂික පිළිබඳ අදාළ ව්‍යවස්ථාපිත වගන්ති යටතේ පාරිතෝෂික ගෙවීමට මණ්ඩලය බැඳී සිටී. මෙම බැඳීම සම්පූර්ණ කිරීම සඳහා සේවයට බැඳුණු මුල් වර්ෂයේ සිට සේවය කරන ලද සෑම වර්ෂයකටම මාස භාගයකට සමාන මුදලක් අවසාන මාසයේ ලබාගත් වැටුප පදනම් කරගෙන සෑම සේවකයෙකු වෙනුවෙන් ම වගකීම් යටතේ වෙන්කිරීම් ලෙස ශේෂ පත්‍රයේ පෙන්නුම් කර ඇත. වර්ෂය අවසානයට ගණනය කරන ලද මුදල හා වර්ෂය මුලදී ඉදිරියට ගෙන ආ මුදල අතර වෙනස මණ්ඩලයේ වියදම් ලෙස සටහන් කර ඇත.

පාරිතෝෂික දීමනා අරමුදලක් ලෙස සටහන් නොවේ. එය වෙන්කිරීම් ලෙස වගකීම් යටතේ ශේෂපත්‍රයේ දක්වා ඇත.

(ආ) නියමිත දායක සැළසුම - සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල

සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායකවීමට සේවකයින් අයිතිවාසිකමක් ලෙස සුදුසුකම් ලබා ඇත.

(ඇ) වගකීම් යටතේ ජංගම වගකීම් ලෙස දැක්වෙනනේ ශේෂ පත්‍ර දිනට වර්ෂයක් තුළ ගෙවීම් සඳහා අදාල වන වගකීම් ය. ජංගම නොවන වගකිම් ලෙස දැක්වෙන්නේ ශේෂපත්‍ර දිනට වර්ෂය ඉක්මවා ගොස් ඇති ගෙවීම නියමිත වන වගකිම් ය. සියලු ජංගම නොවන වගකීම් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දි නිසි පරිදි ගිණුම්ගත කොට ඇත.

2.3.2 **අයභාරය හඳුනාගැනීම**

අයභාරය ලෙස හඳුනාගෙන ඇත්තේ එහි ආර්ථික ප්‍රතිලාභය මණ්ඩලයට ලැබෙන බව අනුමාන කළ හැකි ප්‍රමාණයට ඒ සඳහා දරන ලද ආශ්‍රිත පිරිවැය හෝ දැරීමට අපේක්ෂිත ප්‍රමාණය විශ්වාසනීයව මැනිය හැකි ප්‍රමාණයටයි. අයභාරය ලද ප්‍රතිෂ්ඨාවෙන් හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවෙන් වෙළඳ වට්ටම් සහ විකුණුම් බදු අඩුකොට ඵලඹෙන සාධාරණ අගය මත ගණනය කර ඇත. අයභාරය හඳුනාගැනිම සඳහා පහත සඳහන් විශේෂිත මිණුම් භාවිතා කොට ඇත.

(අ) භාණ්ඩ විකිණීම්

සාමාන්‍යයෙන් භාණ්ඩවල අයිතියෙහි පාලනය දිගින් දිගටම පවත්වා ගැනීමෙන් හෝ විකුණන ලද භාණ්ඩවල ප්‍රමාණාත්මක පාලනය මණ්ඩලය වෙත තබා ගනිමින් භාණ්ඩවල අයිතිය හා සැලකිය යුතු අවදානම් ගැනුම්කරුට මාරුකරමින් භාණ්ඩ විකිණීමෙන් ලැබුණු ප්‍රමාණය අයභාරය ලෙස හඳුනාගෙන ඇත.

(ආ) පොලී ආදායම්

වත්කමේ ඵලදායී ප්‍රතිඵල සැලකිල්ලට ගෙන කාලයට අනුපාතිකව පොලී ආදායම ගිණුම්ගත කොට ඇත.

(ඇ) කුලී ආදායම්

උපචිත පදනම මත කුලී ආදායම හඳුනාගෙන ඇත.

(ඈ) වෙනත්

වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනාගෙන ඇත.

දේපල, පිරියත හා උපකරණ සහ අනෙකුත් ජංගම නොවන වත්කම් ඉවත් කිරීමේ දී උපලබ්ධි කිරීමෙන් ලැබුණු මුදලින් වත්කම් පවත්වාගෙන ගිය පිරිවැය හා විකිණීමේ වියදම් අඩුකිරීමෙන් පසු ලැබුණු ශුද්ධ අතිරික්තය හා පාඩුව ආදායම් ප්‍රකාශනවල ගිණුම්ගත කර ඇත.

2.3.3 **රාජ්‍ය ප්‍රදාන**

(අ) ආදායම් ප්‍රවේශය

මණ්ඩලයේ ප්‍රධාන පරමාර්ථය ලෙස ප්‍රාදේශීය ගොවීනට සහනදායී මිලකට අභිජනනය සඳහා පශු සම්පත් නිකුත් කිරීමට සිදුව ඇති බැවින් අයභාර ආදායම් හෝ විලම්බිත අයභාර ආදායම් ලෙස රාජ්‍ය ප්‍රදානයන් ආදායම් ප්‍රවේශය යටතේ ගිණුම් ගතකර ඇත.

(ආ) ප්‍රාග්ධන ප්‍රවේශය

රජයෙන් ලැබෙන දිරිගැන්වීමක් ලෙස සලකා ප්‍රාග්ධන වත්කම් සඳහා ලැබුණු රාජ්‍ය ප්‍රදානයන් ප්‍රාග්ධන ප්‍රවේශය යටතේ ගිණුම්ගත කර ඇත.

2.3.4 **වියදම් හඳුනාගැනීම**

(අ) අදාළ අයිතමයේ ආදායමට සෘජුව බලපාන ලද වියදම ආදායම් ප්‍රකාශනවල වියදම් ලෙස සටහන් කර ඇත. ව්‍යාපාර පවත්වා ගෙන යාමට හා පිරියත හා උපකරණ ක්‍රියාකාරී ලෙස පවත්වා ගෙන යාමට දරන ලද සියලු වියදම් වර්ෂයේ ලාභය උපයාගැනීමට දායක වූ ලෙස සලකා ආදායම් ප්‍රකාශනවල ඇතුලත් කර ඇත.

(ආ) ආදායම් ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දී වියදමේ ක්‍රියාකාරීත්වයේ ප්‍රගතිය දැක්වෙන පරිදි ඉදිරිපත් කිරීම සාධාරණව අවශ්‍ය බව අධ්‍යක්ෂකවරුන්ගේ අදහස වන බැවින් එකී ආකාරයට ඉදිරිපත් කිරීම් සිදු ඇත.

2.3.5 **ශේෂ පත්‍ර දිනට පසුව ඇති වූ සිද්ධීන්**

මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කග යුතු ප්‍රමාණාත්මක ගැළපිම් ශේෂපත්‍ර දිනෙන් පසු පැනනැගී නැත.

සැසැඳීම් සංඛ්‍යා

සමාලෝචිත වර්ෂයේ ඉදිරිපත් කිරීම්වලට ගැළපෙන පරිදි සමහර සංසන්දනාත්මක සංඛ්‍යා දත්තයන් නැවත වර්ගීකරණය කර ඇත.

3 **අසම්භාව්‍ය වගකීම්**

නීතිපතිවරයා මණ්ඩලය වෙනුවෙන් නඩු සඳහා ඉදිරිපත් වන හෙයින ඔහුගේ මතය අනුව මෙම නඩුවල ප්‍රතිඵලය මත පැනනැගිය හැකි වගකීම් පිළිබඳව ඇස්තමේන්තුවක් කළ නොහැකි හෙයින් අසම්භාව්‍ය බැරකම් සඳහා වෙනකිරීමක් අවශ්‍ය නොවේ.

4 **ගිවිසුම්වලට ඇති අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම / හෝ මණ්ඩලය සමග යෝජිත හා / බැඳුණු ගිවිසුම්**

ශේෂපත්‍ර දිනයේදී අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම මණ්ඩලය හා යෝජිත හෝ ගිවිසුම් බැඳීම් කිසිවක් නොමැත.

5 **පිරිවැටුම**

වර්‍ෂය තුළදී විකුණන ලද භාණ්ඩවලට අදාළ ඉන්වොයිසි කරන ලද වටිනාකම් පිරිවැටුමෙන් නියෝජනය වෙයි.

	2010.12.31 දිනෙන් අවසන් වූ වර්‍ෂය රු.	2009.12.31 දිනෙන් අවසන් වූ වර්‍ෂය රු.
විකුණුම්	1,234,533,833	1,034,633,723
අඩුකලා : අන්තර් ගොවිපල විකුණුම්	(134,811,536)	(144,864,697)
	1,099,722,297	889,769,026

6. **වෙනත් මෙහෙයුම් ආදායම්**

	2010.12.31 දිනෙන් අවසන් වූ වර්‍ෂය රු.	2009.12.31 දිනෙන් අවසන් වූ වර්‍ෂය රු.
බදුකුලී ආදායම්	2,176,854	2,348,534
සේවක ණය පොලී	2,467,350	2,393,365
තැන්පත් පොලී	3,398,188	7,582,328
කුඩා ව්‍යාපෘති වලින් ලාභ / (අලාභ)	1,667,681	159,491
වෙනත් ආදායම්	9,915,291	7,079,147
	19,625,364	19,562,865

7. **මෙහෙයුම් වලින් ලාභ**

මෙහෙයුම් ලාභය ගණනය කිරීමේ දී පහත අයිතමයන් සඳහා අය කර ඇත.

	2010.12.31 දිනෙන් අවසන් වූ වර්‍ෂය රු.	2009.12.31 දිනෙන් අවසන් වූ වර්‍ෂය රු.
ක්ෂයවීම්	32,218,289	62,655,033

8. **බදු**

2006 අංක 10 දරන දේශීය ආදායම් පනත අනුව වර්ෂයේ ලාභය අදාල බදු ගැළපිම් කිරීමෙන් පසු බදු වෙන්කිරීම සඳහා ප්‍රතිපාදන සලසා ඇත.

10. **දේපල පිරියත හා උපකරණ**

	ඉඩම්	ගොඩනැගිලි	යන්ත්‍ර හා පිරියත	වතු උපකරණ	කාර්යාල උපකරණ	ලීබඩු සහ සවිකිරීම්	ඉදිකිරීම් සැකිලි	මෝටර් වාහන	කෙරීගෙන යන වැඩ	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
පිරිවැය										
2010 ජනවාරි 01 දිනට ශේෂය	338,642,967	89,854,630	43,638,343	39,597,987	10,480,605	4,172,421	141,287,036	57,056,676	296,768	725,027,433
එකතු කිරීම්		9,979,944	7,752,458	3,191,257	1,485,000	1,154,121	18,431,137	978,550	2,932,872	45,905,339
ඉවත් කිරීම්			(545,383)	(918,788)		(408)	(553,723)	(820,725)		(2,839,026)
වත්කම්වලට මාරු කල කෙරීගෙන යන වැඩ									(296,768)	(296,768)
2010 දෙසැම්බර් 31 දිනට ශේෂය	338,642,967	99,834,574	50,845,418	41,870,456	11,965,605	5,326,134	159,164,450	57,214,501	2,932,872	767,796,978
ක්ෂයවීම්										
2010 ජනවාරි 01 දිනට ශේෂය	-	39,140,625	15,020,620	27,931,918	7,600,621	1,888,499	96,792,142	50,337,342	-	238,711,768
වර්ෂයට අදාළ ප්‍රමාණය	-	3,323,637	3,947,521	4,640,059	660,207	349,075	17,036,362	2,261,427		32,218,289
ඉවත් කිරීම්	-		(372,883)	(914,776)		(273)	(498,008)	(820,725)		(2,606,665)
2010 දෙසැම්බර් 31 දිනට ශේෂය	-	42,464,262	18,595,258	31,657,201	8,260,828	2,237,301	113,330,496	51,778,044	-	268,323,392
ශුද්ධ පොත් අගය										
2010 ජනවාරි 01 දිනට ශේෂය	338,642,967	57,370,312	32,250,160	10,213,255	3,704,777	3,088,833	45,833,954	5,436,457	2,932,872	499,473,587
2010 දෙසැම්බර් 31 දිනට ශේෂය	338,642,967	50,714,006	28,617,724	11,666,068	2,879,984	2,283,922	44,494,894	6,719,333	296,768	486,315,665

9. **ආයෝජන**

උප සමාගම්වල අයෝජනය රු 15,995,170.61

1995 දී ශ්‍රීලංකා ලිබියා කෘෂිකාර්මික හා පශු සම්පත් සමාගමේ, (මිල නියම නොවන) ආයෝජනවල රුපියල් 15,995,170.61 මණ්ඩලය විසින් ආයෝජනය කර ඇත. උප සමාගමේ කොටස් වලින් 51% ක් මණ්ඩලය හිමිනර ගෙන ඇත. මෙම ආයෝජනය පිරිවැය මත පදනම් ව ගිණුම් තැබීම සිදු කොට ඇත.

සටහන් (11 .1 ශ්‍රී ල. ගි. ප්‍රමිති 26 අනුගමනය කරමින් ශ්‍රී ලංකා ලිබියා කෘෂිකර්ම හා පශු සම්පත් සමාගමේ ආයෝජනය කර ඇත.

11. **වෙනත් වත්කම්**

	2010.12.31 දිනෙන් අවසන් වූ වර්‍ෂය රු.	2009.12.31 දිනෙන් අවසන් වූ වර්‍ෂය රු.
විලම්බිත වියදම්	325,188,669	271,919,709
කල්බදු වත්කම් මත විලම්බිත අයභාරය	(45,017,007)	(46,017,511)
පශු සම්පත් ප්‍රාග්ධනය	201,647,728	182,391,301
පශු සම්පත් විළදෙනුන් / එළුවන් බැංකුව	-	440,001
	481,819,391	408,733,500

12. **දිගුකල් බැරකම්**

		2010.12.31 දිනෙන් අවසන් වූ වර්‍ෂය රු.	2009.12.31 දිනෙන් අවසන් වූ වර්‍ෂය රු.
දිගුකල් ණය	(12.අ)	117,134,489	132,921,968
මුල්‍ය කල්බදු මත බැඳීම්	(12.ආ)	729,164	1,979,167
		117,863,653	134,901,135

12.a. **දිගුකල් ණය**

ණයදුන් තැනැත්තා	පහසුකම් ප්‍රමාණය රු.ද.ල	හේතුව	2010.12.31 දිනෙන් අවසන් වූ වර්‍ෂය රු.	2009.12.31 දිනෙන් අවසන් වූ වර්‍ෂය රු.
ගොවීන්ගේ භාර අරමුදල	102.6	ප්‍රාග්ධන වියදම්	102,662,700	102,662,700
මහජන බැංකුව	220	සෙලාන් බැංකු ණය සේවා	14,471,789	30,259,268
			117,134,489	132,921,968

12.b. **මුල්‍ය කල්බදු මත බැඳීම්**

	31.12.2010 රු.	31.12.2009 රු.
මහජන බැංකුව - කල්බදු		
වර්‍ෂය මුල ශේෂය	3,229,167	4,583,334
අඩුකලා : ආපසු ගෙවීම්	(1,250,003)	(1,354,167)
	1,979,164	3,229,167
අඩුකලා : වර්‍ෂයක් තුළ දී ගෙවිය යුතු ප්‍රමාණය	(1,250,000)	(1,250,000)
වර්‍ෂය අගදී ශේෂය	729,164	1,979,167

13. **මහා භාණ්ඩාගාර ණය**

	2010.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය	2009.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය
භාණ්ඩාගාර ණය	50,000,000	50,000,000
	50,000,000	50,000,000

14. **විලම්බිත වගකීම්**

	2010.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය	2009.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය
විශ්‍රාම පාරිතෝෂික සඳහා වෙන් කිරීම		
වර්ෂය මුල ශේෂය	154,442,001	162,513,072
වර්ෂයට අයකළ ප්‍රමාණය	29,906,056	6,131,944
	184,348,057	168,645,016
වර්ෂය අගය ශේෂය	166,466,691	154,442,001

15. **වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු ශේෂ**

	2010.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය	2009.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය
ණය හිමියෝ	179,049,066	160,198,068
උපචිත වියදම්	31,214,561	32,008,771
වෙනත් ගෙවිය යුතු ශේෂයන්	38,802,254	31,274,636
	249,065,881	223,481,475

ලාභාලාභ ගිණුම

2010 දෙසැම්බර් 31 දිනට අවසන් වූ වර්ෂය සඳහා		2010.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය රු.	2010.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය රු.
විකුණුම්		1,234,533,833	1,034,633,723
අඩුකලා : අන්තර් ගොවිපල විකුණුම්		(134,811,536)	(144,864,697)
		1,099,722,297	889,769,026
අඩුකලා : විකුණුම් බඩු ගත් මිල		(797,818,226)	(718,381,807)
දළ ලාභය		301,904,071	171,387,219
එකතු කලා : මෙහෙයුම් ආදායම්	(ඇමුණුම් 1)	19,625,364	19,562,865
රාජ්‍ය ප්‍රදාන	(ඇමුණුම් 2)	5,125,000	13,661,559
		326,654,435	204,611,643
අඩුකලා : වියදම් සහ පිටත යෑම්			
බෙදාහැරීමේ පිරිවැය	(ඇමුණුම් 3)	3,574,785	4,045,274
පරිපාලන වියදම්	(ඇමුණුම් 4)	107,912,043	114,209,277
වෙනත් වියදම්	(ඇමුණුම් 5)	10,656,712	24,498,613
මූල්‍ය පිරිවැය	(ඇමුණුම් 6)	28,695,065	37,772,053
		(150,838,605)	(180,525,216)
වත්කම් ඉවත් කිරීමෙන් වූ ලාභය	(ඇමුණුම් 7)	3,129,328	475,000
බදුවලට පෙර ලාභය / (අලාභය)		178,945,158	24,561,427

	2010.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය රු.	2010.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය රු.
ඇමුණුම් 1		
වෙනත් ආදායම්		
බදුකුලී ආදායම්	2,176,854	2,348,534
සේවක ණය පොලී	2,467,350	2,393,365
තැන්පත් පොලී	3,398,188	7,582,328
කුඩා ව්‍යාපෘති වලින් ලාභ / (අලාභ)	1,667,681	159,491
වෙනත් ආදායම්	9,915,291	7,079,147
	19,625,364	19,562,865
ඇමුණුම් 2		
රාජ්‍ය ප්‍රදාන		
කිරි ජනප්‍රිය කිරීම	5,125,000	8,437,500
කලල ව්‍යාපෘතිය	-	5,224,059
	5,125,000	13,661,559
ඇමුණුම් 3		
බෙදාහැරීම් පිරිවැය		
බ්‍රෝකර් ගාස්තු	3,574,785	2,246,628
විකුණුම් ප්‍රවර්ධන	-	1,798,645
	3,574,785	4,045,274
ඇමුණුම් 4		
පරිපාලන වියදම්		
ගොවිපල පරිපාලන හා පොදු	13,722,226	34,528,086
වාර්ෂික ප්‍රසාද දීමනා	8,206,000	6,000,000
ප්‍රධාන කාර්යාලය	85,983,817	73,681,191
	107,912,043	114,209,277
ඇමුණුම් 5		
වෙනත් වියදම්		
කලල ව්‍යාපෘතිය	-	12,362,093
බඩ ඉරිඟු වගා කිරීම	2,279,651	(87,143)
නැවුම් කිරි බෙදාහැරීමේ ව්‍යාපෘතිය	8,002,380	12,223,663
ඩිලයිට් ව්‍යාපෘතිය	374,681	-
	10,656,712	24,498,613
ඇමුණුම් 6		
මූල්‍ය පිරිවැය		
බැංකු ගාස්තු	1,877,226	1,110,432
ණය පොලී	6,212,862	9,668,188
වෙනත් ණය පොලී	10,266,270	10,266,270
බැංකු අයිරා පොලී	10,338,708	16,727,163
	28,695,065	37,772,053
ඇමුණුම් 7		
වත්කම් ඉවත් කිරීමෙන් වූ ලාභය		
ජංගම නොවන වත්කම් ඉවත් කිරීම	3,129,328	475,000
	3,129,328	475,000

ගිණුම්වලට අදාළ උපලේඛන

2010 දෙසැම්බර් 31 දිනට අවසන් වූ වර්ෂය සඳහා

	2010.12.31 දිනෙන් අවසන් වර්ෂය
	රු.

1. **විලම්බිත වියදම් - රු. 325,188,669**

	පොල් යටි වගාව නව වගාව	තෘණ වගා කිරීමේ වියදම්	කජු වැවීමේ වියදම්	රබර් වැවීමේ වියදම්	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.
2010.01.01 දිනට ශේෂය	262,264,767	5,691,006	1,335,382	2,628,555	271,919,710
වර්ෂය තුළ දී දරණ ලද වියදම	53,609,517	5,716,490	-	1,833,462	61,159,469
ලාභාලාභ ගිණුමට අයකළ යුතු	(3,427,786)	(4,462,723)	-	-	(7,890,509)
2010.12.31 දිනට ශේෂය	312,446,498	6,944,773	1,335,382	4,462,017	325,188,669

2 **කල්බදු මත විලම්බිත අයභාරය - රු. 45,017,007**

	2010.12.31 දිනෙන් අවසන් වර්ෂය
	රු.
2010.01.01 දිනට ශේෂය	46,017,511
අයභාරයට මාරුකලා - බදු කුලීය සී/ස ලංකා ලිබ් සමාගම	(88,384)
අයභාරයට මාරුකලා - බදු කුලිය සීමිත ග්‍රැන්ඩික්ස් සමාගම	(666,666)
අයභාරයට මාරුකලා - බදු කුලිය සීමිත රජවැල්ල හෝල්ඩිංග්ස්	(245,455)
2010.12.31 දිනට ශේෂය	45,017,007

3. **පශු සම්පත් අගයකිරීම - රු. 282,561,802**

		ප්‍රාග්ධන	වෙළඳ	මුළු එකතුව
එළ ගවයින් / මී ගවයින්		216,685,916	3,922,446	220,608,362
එළුවන්		5,173,211	-	5,173,211
ඌරන්		3,657,566	1,204,453	4,862,019
බැටළුවන්		1,292,274	5,470,553	6,762,827
හාවුන්		-	-	-
කුකුළන්		31,541,003	12,614,332	44,155,335
වටුවන්		-	30,167	30,167
තාරාවනු		-	6,406	6,406
කළුකුන්		-	18,881	18,881
වෙනත්		-	944,596	944,596
	Rs.	258,349,970	24,211,832	282,561,802
25% අඩුකලා		56,702,242	2,649,363	59,351,605
ශුද්ධ වටිනාකම		**201,647,728**	**21,562,469**	**223,210,198**

4 තොග - රු. 168,272,292

පොල් කොප්පරා	රු.	76,628,313
විවිධ නිෂ්පාදන		15,841,212
ගොවිපළවල හා ප්‍රධාන කාර්යාලයේ ඇති වෙනත් තොග		54,240,298
පශු සම්පත් වෙළඳ		21,562,469
	රු.	168,272,292

5 වෙළඳ ණයගැතියෝ සහ වෙනත් ලැබිය යුතු ශේෂ - රු. 145,382,142

වෙළඳ ණයගැතියෝ	(උපලේඛන 5.1)	රු.	64,659,365
තැන්පත් සහ කලින් ගෙවීම්	(උපලේඛන 5.2)		9,943,851
වෙනත් ගැබිය යුතු ශේෂයන්	(උපලේඛන 5.3)		57,459,602
වෙනත් ජංගම වත්කම්	(උපලේඛන 5.4)		13,319,324
		රු.	145,382,142

5.1. වෙළඳ ණයගැතියෝ - රු. 64,659,365

වෙළඳ ණයගැතියෝ	රු.	78,162,929
අඩුකලා : බොල්ණය වෙන්කිරීම		(13,503,564)
	රු.	64,659,365

5.2. තැන්පත් - රු. 9,943,851

තැන්පත්	රු.	8,654,240
කලින් ගෙවීම්		
කලින් ගෙවීම්		1,289,611
	රු.	9,943,851

5.3. වෙනත් ලැබිය යුතු ශේෂ - රු. 57,459,602

සේවක ණයගැතියෝ	රු.	38,681,772
ආර්ථික සේවා ගාස්තු		14,717,971
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව		2,919,209
අයකළ හැකි බදු		1,140,649
	රු.	57,459,602

5.4. වෙනත් ජංගම වත්කම් - රු. 13,319,324,

තවාන් සහ වී වගාව වැනි ගොවිපල සම්පූර්ණ නොකරන ලද ක්‍රියාකාරකම්වලට වැයකළ මුදල		13,319,324
	රු.	13,319,324

6. මුදල් හා මුදල් සමාන වටිනාකම් - රු. 50,489,106

ඉල්ලුම් තැන්පතු - මහජන බැංකුව නාරාහේන්පිට	රු.	21,829,874
ස්ථාවර තැන්පතු - ලංකා බැංකුව		244,449
මහජන බැංකුව - ප්‍රධාන කාර්යාලය		278,306
මහජන බැංකුව - 1001163694865		4,500
මහජන බැංකුව - වරලත් 100120000228		4,024
මහජන බැංකුව - සියළු ගොවිපොලවල්		17,026,787
ඉතිරි කිරීම් ගිණුම්		5,000
මුදල් ශේෂයන්		
අත ඉතිරි මුදල්		2,366,187
අත ඉතිරි මුද්දර		25,896
මාගීස්ථ මුදල්		8,704,084
	රු.	50,489,106

7. **ප්‍රාග්ධන සංචිත - රු. 131,884,429**

වර්ෂීය මුල ශේෂය		132,599,971
උසාවි නියෝග - එළහරක්		2,271,638
කුකුළු පැටවුන් ආනයනය		1,237,290
තෘණ භූමි නඩත්තු		1,000,000
එළහරක් / එළුවන් බැංකුව		-
කලල ව්‍යාපෘතිය		-
උතුරු වසන්තය		(99,470)
කිරිහල් ආයතන		(5,125,000)
		131,884,429

8. **වෙළඳ ණය හිමියෝ සහ වෙනත් ගෙවිය යුතු ශේෂ - රු. 249,065,881**

වෙළඳ ණයහිමියෝ	රු.	179,049,066
උපචිත වියදම්		31,214,561
වෙනත් ගෙවිය යුතු ශේෂ		38,802,254
	රු.	249,065,881

8.1. **වෙළඳ ණය හිමියෝ - රු. 179,049,066**

වෙළඳ ණයහිමියෝ	රු.	179,049,066
	රු.	179,049,066

8.2. **උපචිත වියදම් - රු. 179,049,066**

උපචිත වියදම්	රු.	18,435,401
ගෙවිය යුතු සේ. අ. අ.		4,883,315
ගෙවිය යුතු සේ. නි. භා. අ.		673,555
ගෙවිය යුතු වැට් බදු		7,222,290
ජා. ගො. බ.		-
උ. ගෙ. බ.		-
	රු.	31,214,561

8.3. **වෙනත් ගෙවිය යුතු ශේෂ - රු. 38,802,254**

සේවක ණයහිමියෝ	රු.	15,791,631
වෙන් කිරීම්		9,641,992
තැන්පත්		13,368,631
	රු.	38,802,254

9. **වර්ෂයක් තුළදී ගෙවිය යුතු දිගුකල් ණය ප්‍රමාණය - රු. 17,037,444**

මහජන බැංකුවට ගෙවිය යුතු ණය		15,787,444
මහජන බැංකුවට ගෙවිය යුතු - ශීතකරණ ට්‍රක් රථ		1,250,000
	රු.	17,037,444

10. **බැංකු අයිරා - රු. 34,264,342**

මහජන බැංකුව - 100153693183	රු.	30,974,280
මහජන බැංකුව - 100103694873		2,984,689
අර්තාපල් - 100113694896		-
බඩ ඉරිඟු ව්‍යාපෘතිය - 100138015117		6,088
මහරගම - 100153694880		-
මහජන බැංකුව - වරලත් 100120000228		-
මහජන බැංකුව - ඩිලයිට් 100140003339		299,286
	රු.	34,264,342